**2026.08.11 දින පෙ.ව. 09.30 ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2026 අගෝස්තු මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.**

සහභාගීත්වය :-

1. ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා - ගරු උප සභාපති
3. කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
4. පී. ලෙනිකා දූෂන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
5. ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී
6. ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා - ගරු මන්ත්‍රී
7. ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
8. උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
9. ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
10. එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී
11. මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා - ගරු මන්ත්‍රී
12. එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා - ගරු මන්ත්‍රී
13. සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා - ගරු මන්ත්‍රී
14. ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා - ගරු මන්ත්‍රී
15. කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
16. ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී
17. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
18. ලියනගමගේ අභයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
19. එච්. තිලක් උපුල් චමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී
20. යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
21. ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා - ගරු මන්ත්‍රී
22. බී. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා - ගරු මන්ත්‍රී
23. ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 9.30 ට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ගරු උප සභාපති ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා, ගරු මන්ත්‍රිනී පී. ලෙනිකා දූෂන්ති මැතිතුමිය, ගරු මන්ත්‍රී ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා, ගරු මන්ත්‍රී උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා, ගරු මන්ත්‍රී මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා, ගරු මන්ත්‍රී සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා, ගරු මන්ත්‍රී ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා, ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා, ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා,

ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී එච්. තිලක් උපුල් චමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රිනී යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය හා ගරු මන්ත්‍රී බී. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා යන මහත්ම මහත්මීන්ගේ සහභාගීත්වයෙන් යුතුව සභාවේ කටයුතු ආරම්භ විය.

<u>ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.</u>

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු සභිකවරුන් ද, ප්‍රාදේශීය සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ද, මාධ්‍යවේදී මහත්වරුන් ද සාදරයෙන් පිළිගන්නා ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 09.35 ට ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා, ගරු මන්ත්‍රී ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා හා ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

**1. පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම :-**

1.1. 2026.07.14 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

2026.07.14 දින පැවති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සභිකයින් වෙත මේ වන විට යොමු කර ඇති බවත්, එහි සංශෝධන තිබේ නම් ඒවාට යටත්ව වාර්තාව කියවූවා සේ සලකා සභාව මඟින් සම්මත කිරීමට කටයුතු කරන ලෙසත් සඳහන් කරන ලදී.

<u>සංශෝධන අංක 01 - ගරු මන්ත්‍රී, නිශාන්ත කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධන:-</u>

පසුගිය සභා වාර්තාවේ 12 වෙනි පිටුවේ මාගේ අදහස් දැක්වීම යටතේ සඳහන් වූ “කෙටි කාලයක්” යන්න “මසක කාලයක්” ලෙස සංශෝධනය විය යුතුයි.

ඉහත සංශෝධනයට යටත්ව 2026.07.14 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**2. ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ නිවේදන :-** කිසිවක් නැත

**3. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන ගරු සභාවට ඉදිරිපත් කිරීම :-**

3.1. 2026.07.26 දිනැතිව ඉඳුරුව, යාලේගම, බෝධිනාගොඩ, 70 ඒ ලිපිනයෙහි පදිංචි සේදිල්ලගේ රූපවතී යන අය විසින් “නිවෙස් ගණනාවකට යාමට ඇති පාර නියමාකාරයෙන් සකස් කරවා ගැනීම” යන මැයෙන් නිවාස කිහිපයකටම ගමන් කිරීමට මෙතෙක් ඇති අඩි පාර පුළුල් කර සකස් කර දෙන මෙන් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

3.2. බෙන්තොට, මීරිස්වත්ත, පිලේකුඹුර යන ලිපිනයේ පදිංචි ගිනිගල්ගොඩගේ වජිර සමන් කුමාර (ජා. හැ. අ. 793291531V) යන අය විසින් යාලේගම බෝධිනාගොඩ නිවෙස් කිපයකට යන පාර පුළුල් කිරීම සඳහා යාලේගම ප්‍රදේශයේ ඇති ඔප්පු අංක 1910 දරන තම ඉඩමෙන් කොටසක් පාරට අවශ්‍ය වන පරිදි ලබා දීමට තම එකඟතාවය පළ කරන බව දන්වා 2026.08.08 දිනැතිව අංක 08 යාලේගම ග්‍රාම නිලධාරී ඉදිරිපිට දී අත්සන් තැබූ බවට සහතික කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

**4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :- කිසිවක් නැත**

**5. යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

**5.1. <u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන, ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති, ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට හා ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ යන සභිකවරුන් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනාව :-</u>**

5.1.1. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීමේ හා ප්‍රරෝහණය කිරීමේ කාර්යය සඳහා පොදු පරිපාලන අධිකාරය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇත. එකී සෞඛ්‍ය බලතල ක්‍රියාත්මක කිරීමේ දී බල ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විමසා ක්‍රියා කළ යුතු අතර ඒ සඳහා සෘජුවම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙත සභාවට හෝ සභාපතිවරයාට පැවරුණු සෞඛ්‍ය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා වන බලය පැවරීමක් කළ යුතු බැවින් 1987 අංක 15 දරන පනත ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට පැවරුණු සෞඛ්‍ය බලතල සහ තවදුරටත් ප්‍රාදේශීය සභාව වෙත පහත පනත් හා ආඥා පනත්වලින් පැවරුණු කරුණුවලට අදාළ බලතල කාර්යය සහ කර්තව්‍යය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ඉටු කිරීමෙහිලා ඉදුරුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය ලෙස සලකා පිළිගෙන ක්‍රියාකිරීමටත් ඒ අනුව, ප්‍රාදේශීය සභාව සහ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත පැවරුණු පහත පනත් හා ආඥාපනත්වලට අදාළ සෞඛ්‍ය බලතල නව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය එල්. කේ. කළුබෝවිල මහතා වෙත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 8(2) සහ 216 වැනි වගන්ති ප්‍රකාරව පැවරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

1. 1862 අංක 15 දරන පීඩන ක්‍රියා ආඥා පනත
2. 1893 අංක 09 දරන සෝගාතන ආඥා පනත
3. 1941 අංක 13 දරන ජල භීතිකා රෝගය පිළිබඳ ආඥා පනත

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මේ වන විට නව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයෙක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ කටයුතු කරන බැවින් මින් පෙර සිටි වෛද්‍ය නිලධාරීතුමියට පවරා තිබූ බලතල නව වෛද්‍ය නිලධාරීතුමන් වෙත පැවරීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.2. <u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා :-</u>**

5.2.1. මහ ඉඳුරුව කහවෙගම්මැද්ද මෙරෙන්විගෙවත්ත පළවන පටුමග මීටර් 65 ක් පමණ ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.2. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2026 අනුමත අයවැය ප්‍රතිපාදන අනුව පහත විස්තර සඳහන් වැය ශීර්ෂවලට අදාළ අයවැය ඇස්තමේන්තුගත නොවූ නව ක්‍රියාකාරකම් වෙනුවෙන් වැය දැරීමට අවශ්‍යාව ඇති බැවින් හා වෙන්කළ ප්‍රතිපාදන වසරේ ඉදිරි කාලයට ප්‍රමාණවත් නොවන බැවින් පහත තොරතුරු සඳහන් රු. 34,850,000/- ක පරිපූරක අයවැය ඇස්තමේන්තු පිළිගෙන සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

| ආදායම් ප්‍රභවය | අය ශීර්ෂය | මුදල (රු.) | වියදම් විස්තරය | මුදල (රු.) | වැය ශීර්ෂය |
|---|---|---|---|---|---|
| ස්ථාවර තැන්පත් | ස්ථාවර තැන්පත් | 19,850,000.00 | ප්‍රාග්ධන වැය | 20,000,000.00 | 309 |
| මුද්දර ගාස්තු | 1.6.63 | 15,000,000.00 | වැටුප් (වෙනත් දීමනා) | 1,200,000.00 | 101(9)v |
| | | | වැටුප් (වෙනත් දීමනා) | 1,800,000.00 | 301(9)i |
| | | | වැටුප් (පුහුණු දීමනා) | 250,000.00 | 101(9)iv |
| | | | සැපයුම් හා උපකරණ | 500,000.00 | 103(1) |
| | | | සැපයුම් හා උපකරණ | 800,000.00 | 103(2) |
| | | | සැපයුම් හා උපකරණ | 200,000.00 | 103(6) |
| | | | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 1,000,000.00 | 104(1) |
| | | | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 1,700,000.00 | 105(9)iii |
| | | | සැපයුම් හා උපකරණ | 600,000.00 | 203(8) |
| | | | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 1,500,000.00 | 205(6)ii |
| | | | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 1,000,000.00 | 304(1) |
| | | | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 1,500,000.00 | 304(4) |
| | | | සැපයුම් හා උපකරණ | 2,000,000.00 | 503(8) |
| | | | ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 800,000.00 | 607(4)iii |
| | | 34,850,000.00 | | 34,850,000.00 | |

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**

ස්ථාවර තැන්පතුවලින් රු. 19,850,000/-ක මුදලකුත් මුද්දර ගාස්තුවලින් රු. 15,000,000/- ක මුදලකුත් වැය ශීර්ෂ මාරු කිරීම සඳහා පරිපූරකයක් ලෙස යොදා ගෙන එම මුදල් අවශ්‍ය කරනු ලබන කාර්යයන් අදාළ මුදල් ප්‍රමාණයන් සමඟ ම මෙහි දක්වා තිබෙන අතර, මේ පිළිබඳ මන්ත්‍රීවරුන්ට අදහස් ඉදිරිපත් කිරීමේ අවස්ථාව මෙතැන් සිට ලබා දෙන බව සඳහන් කරන ලදී.

**ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා**

පනතේ 168, 171 හා ඉන් ඔබ්බට ගරු සභාපතිතුමන් වෙත පැවරී ඇති බලතල අනුව ඉදිරිපත් කර ඇති පරිපූරක ඇස්තමේන්තුවේ නිරාකරණය කර ගැනීමට අවශ්‍ය කරුණු කීපයක් පවතින බවත්, ඒ අනුව සභාව සතු දේපළක් සේ සැලකිය හැකි ස්ථාවර තැන්පතු නැවත ගිණුමට බැර කරගන්නේ අපි අසමත් වෙලා ද ආදායම් උත්පාදනය කර ගන්න? පසුගිය සභා වාරයේ දී නදීෂාන් මන්ත්‍රීතුමාම මතු කළ කොහොඹ ගස්

සම්බන්ධ ගැටලුව ගත්තොත් ගසේ වටිනාකම ඉහළ අගයක පැවතුණ ද වෙන්දේසි වෙලා තිබුණේ 10 න් පංගුවක් වැනි ඉතා අඩු අගයකට. මෙවැනි සිදුවීම් ලැබෙන්න තියෙන ආදායම අඩු වීමට හේතුවක්. මුද්දර ගාස්තුත් අපට නියමිත වෙලාවට ලැබෙන දෙයක්. වැය ශීර්ෂ 309 යටතේ මෙහි සඳහන් වන ප්‍රාග්ධන වැය සඳහා අයවැය මුදලින් මුදලක් වෙන් වී නොතිබීම මෙන් ම 4 වන වැය ශීර්ෂයක් සඳහන් නොවීම, මෙහි 309 යටතේ භෞතික සැලසුම් හා මංමාවත් අංශයට අදාළ වත්කම් අත්පත් කර ගැනීමේ වියදම්, වැට මායිම් ගැසීම් සඳහා අයවැය ලේඛනයේ මුදලක් වෙන් වී නැති නිසා ද මිලියන 20 ක් ප්‍රාග්ධන වැය සඳහා වෙන් කරලා තියෙන්නේ? වැය ශීර්ෂ 101(9)(V) යටතේ වන වැටුප් හා වෙනත් දීමනාවල සඳහන් වෙනත් දීමනාවල අර්ථ දැක්වීමක් දක්වා නැ. සංවර්ධනය සඳහා පරිපූරක අයවැය ඇස්තමේන්තුවේ නඩත්තු වියදම් සඳහා පමණයි නේද මුදල් වෙන් කර ගෙන තිබෙන්නේ? සංවර්ධන ක්ෂේත්‍රය සඳහා යෝජනා මුකුත් නැද්ද? මේ සම්බන්ධයෙන් විරුද්ධ වීමක් නොවන බවත්, පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ අයිතිය සභාවට තිබෙන අතර මේ සම්බන්ධව කරුණු නිරාකරණය කරගෙන ඉදිරියට යා යුතු බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, රංජිත් ප්‍රනාන්දු මැතිතුමා</u>

කොඩිතුවක්කු මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට 101(9)(V) වන භෞතික සැලසුම් හා මංමාවත් අංශයට අදාළ වත්කම් අත්පත් කර ගැනීමේ වියදම් හා වැට මායිම් ගැසීම යන වැය ශීර්ෂයට අදාළව මිලියන 20 ක් වෙන් කර තිබීම සම්බන්ධව පැහැදිලි කිරීමක් දැන ගැනීමට අවශ්‍යයි. ඒ වගේම මේ පරිපූරක ඇස්තමේන්තුවෙන් මිලියන 34 ½ ක් ඇස්තමේන්තු කර සභාවේ අනුමැතිය ඉල්ලනවා රු. මිලියන 33.5 ක සංවර්ධන යෝජනාවකට. ඒ අනුව අපි ආදායම් ගැනීමේ ක්‍රමයේ දී පොඩ්ඩක් පස්සට ගිහින් නේද? උදාහරණයක් ලෙස වරිපනම්වලින් ආදායම් බලාපොරොත්තු වෙනවා මේ අවුරුද්දට රු. මිලියන 24.66 ක්. අපි මේ දක්වා අයකර ගෙන තියෙනවා රු. මිලියන 20.66 ක්. තව මිලියන 4යි අඩු. ජනවාරි, පෙබරවාරි, මාර්තුවල විතරක් වරිපනම් ආදායම ලැබිලා තියෙනවා රු. මිලියන 17 ක්. ඉතිරි මාසවල ලැබිලා තියෙන්නේ රු. මිලියන 2.4 යි. තව හිඟ වරිපනම් අයකර ගන්න තියෙනවා රු. මිලියන 9 ක්. එයින් 50% ක් වත් අයකර ගන්න උත්සාහ කරනවා නම් හොඳයි. එහෙමත් බැරිනම් ඒක හිඟ මුදල් කියන එක පැත්තට නොදා ඉන්න. ඊළඟට තවත් ප්‍රධාන වැය ශීර්ෂයක් වන මුද්දර වියදම් මේ දක්වා රු. මිලියන 22 ක් ලැබී තියෙනවා. අයවැයේ දක්වලා තියෙන්නේ රු. මිලියන 37 යි. ඒ ඉතුරු මිලියන 15 ම ඇස්තමේන්තුවේ සඳහන් වෙලා තියෙනවා. මධ්‍යම රජයේ ප්‍රතිපාදන සඳහා මිලියන 64 යි වෙන් කර තියෙන්නේ අයවැයෙන්. මිලියන 30 යි ලැබිලා තියෙන්නේ. පුළුවන් විදිහට සම්පත් ලැබෙයි. වැටුප් සඳහා අය කරන 20% අඩු ආදායම්ලාභී සභාවලින් ඉවත් කිරීමේ තීරණයකුත් රජයෙන් අරගන්නා බවට ආරංචියක් තිබෙනවා. ඉන්ධනවලට අපි අයවැයෙන් වෙන් කර තිබුණා රු. මිලියන 2.5 ක්. පරිපූරක ඇස්තමේන්තුවෙන් බලාපොරොත්තු වෙනවා. රු. ලක්ෂ 8 ක්. ඉන්ධන මිල වැඩිවීම මත එය නිවැරදියි. ඊළඟට වාහන නඩත්තුවට අයවැයෙන් වෙන් කර තිබ්බා මිලියන 3.8 ක්. තවත් මිලියන 2 ක් බලාපොරොත්තු වෙනවා පරිපූරක ඇස්තමේන්තුවෙන්. අර කිව්වා වගේ සංවර්ධන වැඩකටයුතුවලට මේකේ මුදල් ඉතුරුයි ද? ඒ ගැන පැහැදිලි කිරීමක් අවශ්‍යයි. මට මතකයි සභාපතිතුමා කිව්වා නිලුපුල් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයකට පිළිතුරක් වශයෙන් බෙන්තර තියෙන පාරවල් ටික හදන්න සක්කරයා බුදු වෙලා ආවත් බෑ කියලා. ඒ හින්දා මම යෝජනා කරනවා අපේ ආදායම් වැඩි කරන මාර්ගවලට උදාහරණයක් ලෙස ගොඩනැගිලි සැලැස්මක් අනුමත කරගන්න යම් පුද්ගලයෙක් ආවොතින් එයාගේ වරිපනම්, බලපත්‍ර ගාස්තු ආදිය හිඟ පවතිනවා නම් ඒවා පරීක්ෂා කරගෙන ඒවා ගෙවා දැමීමෙන් පසු ඒ ගොඩනැගිලි සැලැස්මවල් අනුමත කරන විදියට අපිට යන්න පුළුවන් නම් ඒකත් හොඳයි. දැනටත් ඒක ක්‍රියාත්මක වෙන්නත් පුළුවන්. මා උදාහරණයක් පමණයි කිව්වේ. ඒ විදියට ආදායම් වැඩි කර ගන්න ක්‍රමවලට අපට යන්න පුළුවන් නම් ආදායම ඉහළ නංවා ගැනීමට හැකිවන බව මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, රංජිත් උඩේසිංහ මැතිතුමා</u>

ඉදිරි කාලය සඳහා මහජන අවශ්‍යතාවයන් ඉටු කිරීම වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමට නෛතික බලයක් සභාපතිවරයාට තිබෙන අතර පසුගිය අයවැය වාර්තාව හා මෙම පරිපූරක ඇස්තමේන්තුව සමඟ සිදු කළ සංසන්දනයෙන් නිරීක්ෂණය වූ කරුණු කීපයක් සභාවට ඉදිරිපත් කර පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වන බවත්, ගියවර අයවැය වාර්තාව අය ශීර්ෂය හා වැය ශීර්ෂය සමපාත වී රුපියල් දෙදහස් ගණනක අතිරික්තයක් ද සමඟ සම්මත වූ නමුත් අයවැයේ යම් අසමතුලිතතාවයක් සිදු වී අගෝස්තු මාසය වන විට ඉදිරි කාර්තුවේ මූලික මහජන අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වී ඒ වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තුවක් යොදන්න සිද්ධ වෙලා. අයවැය ලේඛනයේ වැඩසටහන් අංක අනුපිළිවෙලක් තිබෙන නමුත් කොඩිතුවක්කු මන්ත්‍රීතුමා සඳහන් කළා වගේ එහි 4 වැඩ සටහන නොමැති වීම සම්බන්ධයෙන් දැන ගැනීමට අවශ්‍යයි. එය යම් අතපසුවීමක් ද නැතිනම් නගර සභා මහ නගර සභාවලට අදාළ වන දෙයක් ද? අපි අයවැයේ ආදායම් ප්‍රභවයක් ලෙස මුද්දර ගාස්තු ඉදිරිපත් කරමින් වැය ශීර්ෂ 1.6.63 යටතේ රු. මිලියන 15 ක මුදලක් බලාපොරොත්තු වෙනවා. 2026 අයවැයෙන් රු. මිලියන 37 ක් වෙන් කර ගත්තා මුද්දර ගාස්තු වියදම්වලින්. දැනට පරිපූරක අයවැයේ ඉදිරිපත් කරන මිලියන 15 එම වෙන්කර ගත් මුදලට අමතරව ද නැතිනම් ඒ යටතේ ද යන්න පිළිබඳවත් දැන ගන්න කැමතියි. ඒ වගේම ප්‍රාග්ධන වැය, වියදම් ශීර්ෂ 15 ක් යටතේ ඉදිරිපත් කරලා තියෙනවා. 309 හි සඳහන් ප්‍රාග්ධන වැය යටතේ ගියවර අයවැය ලේඛනය හා මෙම පරිපූරක අයවැය ඇස්තමේන්තුව සංසන්දනය කිරීමේ දී යම් ගැටලුවක් මතු වෙනවා. වැය ශීර්ෂයේ අංකය එකම වුණාට ඉදිරිපත් කරන කරුණු පිළිබඳ යම් පැහැදිලි කිරීමක් අවශ්‍යයි. ඒ වගේම ඉදිරි මාස සඳහා දැනට උත්පාදනය නොවූ ඉදිරියේ දී උත්පාදනය වීමට මුදලක් තිබෙනවා. ඒ මුදල අපිට පරිපූරක ඇස්තමේන්තුව ගළපා ගැනීමේ දී ප්‍රමාණවත් වෙයි ද නැතිනම් අභිබවා යයි ද කියන එකත්, ඒ මුදලත් මිලියන 34 ක පරිපූරක ඇස්තමේන්තුවත් කොතෙක් දුරට සමපාත වෙනව ද කියන එක පිළිබඳවත් පැහැදිලි කිරීමක් අවශ්‍යයි. ඒ වගේම ශීර්ෂ 15 ක් යටතේ ඉදිරිපත් කරපු කරුණුවල දී 101(5)(V) යටතේ වැටුප් හා වෙනත් දීමනාවලට රු. මිලියන 12 ක් වෙන් කරලා තියෙනවා. ප්‍රවාහන අවශ්‍යතා හා ආවශ්‍යක සේවා සඳහා මිලියන 17 ක්, ඊළඟට 5 කොටසේ ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර යටතේ අයවැයෙන් ඉල්ලා තියෙන්නේ ලක්ෂ 2යි. මෙතන ඉල්ලලා තියෙනවා ලක්ෂ 8 ක්. අවසන් කාර්තුව සඳහා ලක්ෂ 6 ක වැඩිවීමක්. ඒ පිළිබඳවත් පැහැදිලි කිරීමක් අවශ්‍යයි. 205(9) යටතේ අයවැයෙන් වෙන් කරලා තියෙන්නේ ලක්ෂ 2 ක වගේ මුදලක් නමුත් පරිපූරකයෙන් ලක්ෂ 17 ක ප්‍රමාණයක් ඉල්ලලා තියෙනවා. එතනත් ලක්ෂ 15 ක වගේ වැඩිවීමක් තියෙනවා. පනතේ බලතල අනුව යම් යම් හුවමාරු කර ගැනීමේ හැකියාවන් තියෙන්නත් පුළුවන්. එය ආරෝපණය කර ගැනීමට හෝ එය උපයෝගී කර ගැනීමට මෙසේ වැඩි කර ගත්තා ද එයත් පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

සභාපතිවරයා ලෙස මෙසේ සතුටින් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්නේ ආදායම අහිමි වෙලා නෙවෙයි හිතුවට වඩා ආදායම වැඩිවෙලා නිසා. අගෝස්තු 01 වන දා වෙන විට බෙන්තර ප්‍රාදේශීය සභාවේ ලැබිය යුතු ආදායම් ප්‍රමාණය ඉහළ ගිහින් තියෙනවා. ඒ නිසා සභාපතිවරයා විදිහට මම කල්පනා කරා අපි හැමෝම බලාපොරොත්තු වෙන්නේ මේකේ සංවර්ධනයක් නිසා බැංකුවේ ගොඩ ගහලා තියන්නේ නැතුව දෙසැම්බර් 31 දක්වා සභාව පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රමාණය සහ හදිසි අවශ්‍යතා වෙනුවෙන් යම් මුදලක් පමණක් ස්ථාවර තැන්පතු ලෙස තබා ගන්න. මේ ස්ථාවර තැන්පතුවලින් අයින් කරන්නේ මිලියන 20 ක්. ඒ වගේම ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු සඳහා ලැබෙන්නේ 8% ක වගේ මුදලක්. නමුත් ගෝනගල රුහුණු සංවර්ධන බැංකුවේ 10% පමණ පොලියක් ලැබෙන නිසා මුද්දර ගාස්තු ලෙස ලැබුණු රු. ලක්ෂ 250 ක මුදලක් එහි තැන්පත් කළා. ඒ නිසා මුදල් හිඟ නිසා නෙවෙයි අවශ්‍යතාවය මතයි පරිපූරකයක් ඉදිරිපත් කළේ. වැටුප් හා වෙනත් දීමනා ලෙස තිබෙන ලක්ෂ 12 ගැන කිව්වොත් අපි මුලින් තීරණය කළා අපේ

සභාවේ සේවකයින් හරහාම මුර සේවයේ කටයුතු සිදු කර ගන්න. නමුත් නිවාඩු ගන්න කොට, අතිකාල ගන්නකොට සිදුවෙන අපහසුතා නිසාත්, වෙනත් මුර සේවයක් යොදා ගත්තම ඒ අයටම වෙන් වුණ නිල ඇඳුමක් තිබෙන නිසා ඒ අයට යම් අභිමානයක් තිබෙන නිසාත් පෞද්ගලික අංශයෙන්ම ආරක්ෂක සේවාව ලබා ගන්න අදහස් කළා. නමුත් පසුගිය අයවැය සකස් කරන කාලයේ අපේ සේවකයින් ලවාම මුර කටයුතු සිදු කර ගන්න තීරණය කරලා තිබුණ නිසා මේ සඳහා මුදලක් වෙන් කළේ නෑ. ඒ නිසා ඒ සඳහා තමයි මේ මුදල වෙන් කරලා තියෙන්නේ. ඒ අයගේ කාලය ඉවර වෙන්න තිබුණේ මීට මාස 2 කට පෙර. ඒ අවස්ථාවේ ඒ අයගේ සේවය තවත් අවුරුද්දකින් දීර්ඝ කළා. තවත් වැටුප් හා දීමනා ලෙස වෙන් කර තියෙන්නේ වෘත්තීය පුහුණු අධිකාරියෙන් පැමිණෙන සිසුන් සඳහා. මීට පෙර ඔවුන් සඳහා දිනකට රු. 500/- ක දීමනාවක් ගෙවූ නමුත් දැන් ඒක රු. 1,000/- ක් කරලා. ඒ වෙනුවෙන් යන මුදල තමයි ඒ දක්වලා තියෙන්නේ. සැපයුම් හා උපකරණ කියන එකෙන් අදහස් කරන්නේ ප්‍රදේශයේ අක්‍රීය වෙලා තියෙන විදුලි පහන් නඩත්තු කටයුතු සඳහා වැයවන මුදල්. මේ වන විට ඒවයේ මිල ගණන් වැඩි වෙලා තියෙනවා. වයර් කෝඩ් එකේ ඉඳන් හැම එකක්ම ගණන් වැඩිවෙලා තියෙන්නේ. ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාවෙන් වෙන් කරන්නේ වැඩිපුරම වාහන අලුත්වැඩියාවට. හැම මුදල් කමිටුවකටම එනවා වාහන 02 කවත් ඇස්තමේන්තු ලක්ෂ 15 ට එහා. PF රථය හැර අනෙක් වාහන සියල්ල අවුරුදු 10 පැනලා තියෙන්නේ. සමහර ඒවා තියෙනවා අවුරුදු 25 ක් 30 ක් වෙන ඒවත්. අදත් ලයිට් හදන්න යන්න විදිහක් නැහැ ඒ වාහනේ ඔයිල් ලීක් එකක් තියෙනවා. ප්‍රවාහන හා ආවශ්‍යක සේවා කියලා මිලියන 30 ක් දාලා තියෙන්නේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කරන තක්සේරුවට. ඒ සඳහා පසුගිය සභාවක දී අනුමැතියත් ලබා ගත්තා. අවසානයේ දී ඒ අයට ගෙවන්න ලොකු ගාණක් එනවා. ගියවර අයවැයේ ඒ ගාන වෙන් වුණේ නෑ. වැඩේ පටන් ගන්නත් කලින් 20% ක් අපි ඒ ආයතනයට බැඳලා තියෙන්නේ. තක්සේරුව ඉවර වෙනකොට සමස්ථ තක්සේරු ආදායමෙන් 1% ක මුදලක් ඒ අයට ගෙවන්න ඕනේ. ලබන අවුරුද්ද වෙන විට ආදායම මීට වඩා වැඩිවෙයි කියන බලාපොරොත්තුවෙන් තමයි මේ දේ කරන්නේ. තක්සේරු කරාම සාමාන්‍යයෙන් වරිපනම් ආදායම 35% කින්වත් වැඩිවෙන්න ඕනේ. පසුගිය අවුරුද්දට වඩා මේ වන විට තෙල් මිල ඉහළ ගිහින් තියෙනවා. ඒ වෙනුවෙනුත් මුදලක් වෙන් වෙලා තියෙනවා. ඒ වගේම වසර 2, 3 ක් ඇතුළත මේ ප්‍රදේශයේ ඉඩම් මිල ඉහළ ගියා. ඒ නිසා මුද්දර ගාස්තු ආදායමත් ඉහළ යනවා. මේ අවශ්‍යතාවයන් අනුව ප්‍රාග්ධන වියදම්වලට මිලියන 20 ක් දාලා තියෙනවා. ගිය වර්ෂයේ මුදල් නොමැති නිසා සංවර්ධන යෝජනා අඩුවෙන් තමයි කරන්න වුණේ. ඒ නිසා වැඩි මුදලක් වෙන් කරන්නේ ඒ සඳහා. ආධාර මුදල් කියලා වෙන් කරලා තියෙන්නේ නිවාස හා ප්‍රජා කමිටුවට නිවාස හදන්න, ලයිට් අරන් දෙන්න ඉදිරිපත් වන යෝජනා සඳහා. හැමදාම සිදු කරන පාරවල් හදන එක, වතුර දෙන එක, කසල අදන එකට එහා ගිහින් බෙන්තර ජනතාවට සේවයක් කිරීමට මේ මඟින් කටයුතු කළ හැකි බවත්, ඊට අදාළව කනහින්තොට ප්‍රදේශයේ නිවසක් බලන්න පසුගිය දිනක ගියා. පාසල් යන වයසේ ළමයි දෙන්නෙක් හිටියා. සැමියා හැර ගිහින්. ඒ අයගේ වැසිකිළිය කැඩිලා ගිහිල්ලා. මේ වන විට සාරි මඟින් ආවරණය කරගෙන ඉන්නේ. ඒ පවුල වෙනුවෙන් රු. 50,000/- ක් නොව සමස්ථ වැසිකිළි පද්ධතියම සාදා දීමට එම අවස්තාවේ දී තීරණය කළ බවත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 10.15 ට මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

<u>කාරක සභා අවස්ථාව</u>

<u>**ලේකම්, ඒ. එච්. රවීන්ද්‍ර ලසන්ත මහතා**</u>
309 වැඩසටහන යටතේ ප්‍රාග්ධන වැය සඳහා මාර්ග පාලම් බෝක්කු ආදී මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන ලද අලුත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මෙම මුදල් වෙන් කර ඇති බවත්, සෑම කොට්ඨාසයකටම ලක්ෂ 15 ක 20 ක පමණ මුදලක් වෙන්කර ඇස්තමේන්තු සකස් කර තිබෙන බවත්, පසුගිය අයවැයේ ප්‍රාග්ධන වැයවලට වැටුප් ප්‍රතිපූර්ණ 40% ක් කප්පාදු කිරීමත් සමඟ පුනරාවර්තන වියදම් සඳහා ලොකු ප්‍රාග්ධන වැයක් අයවැයෙන් වෙන් කරලා තිබුණෙ නෑ. පළාත් නිශ්චිතවලින් ලොකු මුදලක් අයවැයට දාලා තියෙනවා. ඒ ප්‍රමාණය නොලැබුණත් ඒ වැය ශීර්ෂයේ සල්ලි තියෙනවා. පළාත් නිශ්චිතවලට වෙන් කරපු මුදලින් තමයි මෙතෙක් කල් ප්‍රාග්ධන වැය සිදු කළේ. දැන් ඒ මුදල ඉවරයි. ඒ නිසා ප්‍රාග්ධන වැය දාන්න වෙනවා. ගිය අවුරුද්දේ ප්‍රාග්ධන වැය දාලා නැත්තේ ඉහත හේතුව මත අයවැය සමපාත කරගන්න මුදල් නොතිබූ නිසා බව ද සඳහන් කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා**</u>
309 යටතේ 4 වෙනි වැඩසටහන නොමැති වීම පිළිබඳවත් දැන ගැනීමට අවශ්‍යයි.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>
පාර්ලිමේන්තුවේ අයවැය, පළාත් සභාවේ අයවැය සමතුලිත කරන විදියට නෙවෙයි ප්‍රාදේශීය සභාවල අයවැය සමතුලිත කරන්නේ. හිඟ තියන්න බෑ. ඒ නිසා අපට සිද්ධ වෙනවා සමපාත කරන්න. අපිට ලැබුණට පස්සේ ක්ෂේත්‍රවලට මුදල් දාන එක හරි. නමුත් ගිය අවුරුද්දේ අපිට තිබුණ මුදලත් එක්ක ගැටලුවක් තිබුණා. මේ අවුරුද්දේ තීන්දුවක් තිබුණා දැනට රජයේ සේවකයින්ගේ වැටුප 20% ක් ප්‍රතිපූර්ණය කිරීම ඉදිරියේ දී 40% ක් දක්වා වැඩි කිරීමට. ඒ නිසා ඇත්තටම අපට අයවැයේ පාරවල් හදන්න, සංවර්ධන කටයුතු සඳහා සල්ලි තිබුණෙ නෑ. පළාත් නිශ්චිතවලින් මුදල් ලැබෙනවා කියන උපකල්පනය මත තමයි අයවැය සමපාත කරේ. නමුත් මේ පාර සල්ලි දාන්නේ අපි ළඟ සල්ලි තියෙන නිසා බවත් මෙහි දී සඳහන් කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා**</u>
නමුත් තවමත් ඉන් අය කරන්නේ 20% යි නේද?.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>
ගිය සැරේ අපිට චක්‍රලේඛවලින් දැනුවත් කිරීමක් කළා අවුරුදු 4 ක් ඇතුළත සභාවල සියලු වැටුප් සභාව විසින් දැරිය යුතුයි කියලා. එහි 1 වන අදියර විදියට ගිය අවුරුද්දේ 20% ක් අය කරන්න පටන් ගත්තා. ඒ කියන්නේ ලක්ෂ 150 ක් පමණ. දැනට වර්ෂයකට මෙම මුදල ගෙවමින් ඉන්නවා. වැටුප් වැඩිවෙනකොට මෙම මුදල තව වැඩි වෙනවා. 40% කරොත් අපිට ලක්ෂ 350 ක් විතර ගෙවන්න වෙනවා. තවම ඒක ක්‍රියාත්මක නොකරපු නිසා ඒ සඳහා වෙන් කරපු මුදල් ඉතිරි වුණා. ඒ වගේම තව මේකේ සඳහන් වෙන්නේ රු. 3,000/- බැගින් දෛනිකව ගෙවලා බඳවාගෙන ඉන්න සේවකයින්ගේ වැටුප්. දවසකට රු. 3,000 බැගින් 6 දෙනෙකුට රු. 18,000/- ක් ගෙවීමට සිදු වන බවත් සඳහන් කරන ලදී.

<u>**ලේකම්, ඒ. එච්. රවීන්ද්‍ර ලසන්ත මහතා**</u>
88 මූල්‍ය හා පරිපාලන රීතිවල තියෙන ආකෘතිය තවමත් සභාවල භාවිත වෙන බවත්, අතීතයේ ප්‍රාදේශීය සභාවලට තිබූ ජල දෙපාර්තමේන්තුව මෙම 4 හි ජල වැඩසටහන ලෙස තිබෙන අතර මෙය බවුසරෙන් වතුර සැපයීම නොවන බවත්, ජලය හා විදුලිය අතීතයේ සභාවල සෘජුවම සිදු කළ විෂයන් 02 ක් වන නමුත් වර්තමානයේ සිදු නොකරන නිසා ඒ සඳහා මුදල් වෙන් නොකරන බවත් සඳහන් කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, රංජිත් ප්‍රනාන්දු මැතිතුමා**</u>
කලින් මාසෙත් ස්ථාවර තැන්පතු නිදහස් කරලා ලබාගෙන තියෙනවා මිලියන7.5 ක්. ඊට කලින් මාසෙත් නිදහස් කරලා තියෙනවා මිලියන 5 ක්. මේක පුරුද්දකට ගියෝතින් ඔක්කොම නිදහස් කරගෙන ගිහිල්ලා මුදල් නැතිවෙලා යාමට ඉඩ තිබෙන බව සඳහන් කරන ලදී.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>
අපි අතේ මුදල් රඳව ගන්නේ නැති නිසා එය සම්ප්‍රදායක් ලෙස නිදහස් කිරීමට සිදු වෙනවා. මාසිකව හෝ පොළියක් ලැබෙන ගිණුමක මුදල් තැන්පත් කළ යුතුයි. වැඩි පොළියක් ලබා ගැනීමයි මෙහි අරමුණ. ඒ නිසා අවුරුද්ද මුලම අපිට වරිපනම්වලින් ලැබෙන ආදායම ස්ථාවර තැන්පතු ලෙස දමනවා. ඊට පස්සේ අපිට ආදායමක් ලැබෙන්නේ නැහැ. ඊට පස්සේ අපිට අවුරුද්ද ගෙවන්න වෙන්නේ අර දාපු ස්ථාවර තැන්පතුවල මුදලින්. ජංගම ගිණුමේ ලොකු මුදලක් තියාගන්නේ නෑ පොලියක් නැති නිසා. ඒ නිසා මුදල් අවශ්‍යතාවයන් එනකොට සැරින් සැරේ ස්ථාවර තැන්පතුවලින් මුදල් ලබා ගන්න වෙනවා. ලොකු සංවර්ධන යෝජනා සඳහා යොමු නොවී සභාව ලබන අවුරුද්දේ මාර්තු දක්වා දුවන්න තරම් ප්‍රමාණවත් මුදලක් මේ වෙනකොට සභාව සතුව ස්ථාවර තැන්පතුවල පවතින බව ද සඳහන් කරන ලදී..

- මෙම අවස්ථාවේ දී කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 10.25 ට කාරක සභාව නැවත මහ සභාව බවට පත් විය.

<u>මහ සභාව</u>

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.3. <u>ගරු මන්ත්‍රී, රුසිත නන්දන තුෂාර මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා :-</u>**

5.3.1. කොබෙිදූව සූරියවිමන මාර්ගයේ කොබෙිදූව පාසල කෙළවර පිහිටි අසම්පූර්ණ වූ මීටර් 40 ක පමණ කොටස කොන්ක්‍රීට් යොදා සම්පූර්ණ කිරීමට සහ එම මාර්ගය උඩ පැත්තේ මාර්ගයේ කාණුව බැකෝ යන්ත්‍රය යොදා පිළිසකර කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, රුසිත නන්දන තුෂාර මැතිතුමා**</u>
මෙම මාර්ගයේ දෙපැත්තෙන්ම කොන්ක්‍රීට් කර ඇති නමුත් මැද ඉතා අබලන් කොටසක් ඉතිරි වී ඇති නිසා ජනතාව මාර්ගය සම්පූර්ණයෙන් භාවිත නොකර කොන්ක්‍රිට් කර ඇති කොටස් පමණක් භාවිත කිරීමට යොමුව ඇති නිසා මෙම මාර්ගයේ මැද කොටස ද කොන්ක්‍රීට් කර මාර්ගය සම්පූර්ණයෙන් භාවිතයට ගත හැකි ලෙස සකස් කිරීම මෙන්ම එම මාර්ගයට උඩින් ඇති මාර්ගයේ කාණු පද්ධතියක් නොමැති නිසා වැසි සහිත දිනවල දී උඩින් ඇති මාර්ගය සේදී පැමිණෙන වතුර පාර කෙලින්ම මෙම මාර්ගයට වැටෙන නිසා උඩ මාර්ගයේ කාණු පද්ධතිය ද පිළිසකර කිරීම සුදුසු වන බව මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.3.2. කටුවත්ත වැලි ගොඩැල්ල මාර්ගයේ කෙළවර මීටර් 40 ක ප්‍රමාණය කොන්ක්‍රීට් යොදා පිළිසකර කර දෙන ලෙස යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, රුසිත නන්දන තුෂාර මැතිතුමා</u>
වැසි දිනවල මෙම මාර්ග කොටස සෝදාගෙන යෑම මෙන්ම මාර්ගය ලිස්සන සුළු වීම නිසා මාර්ගයේ කෙළවර පවතින නිවාස 04 ක පමණ ජනතාව දැඩි අපහසුතාවයකට පත් වී ඇති බැවින් එම කොටස කොන්ක්‍රීට් කර දීම සුදුසු බව සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මුදල් වෙන් කොට ඇත්තේ පසුගිය සභාවල දී ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සඳහා වන බැවින් ඉදිරියේ දී නැවත ප්‍රතිපාදන ලැබුණොත් මේ පිළිබඳ සලකා බලන බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.4.** <u>**ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා:-**</u>

5.4.1. යාත්‍රාමුල්ල කොට්ඨාසයේ අංගාගොඩ වසමේ පිටාරඹ ධර්ම විජයාරාම පන්සල පිටුපස කාණුව දිගු කාලයක සිට සුද්ධ පවිත්‍ර කර නොමැත. මෙම කාණුවේ වතුර බෙන්තොට දුම්රියපොළ අසලින් මුහුදට ගලා බසින ආකාරයට සකසා ඇත. මෙම කාණුව වහින විට උතුරා පන්සල අසල සිට දිගටම ඇති විලා හා සංචාරක ආපනශාලාවලට මහත් පීඩාවක් ගෙනෙයි. එම කාණුව සුද්ධ පවිත්‍ර කර දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා</u>
මෙම මාර්ගය නිරීක්ෂණය කිරීමට ගිය අවස්ථාවේ මාර්ගයේ දිගට වැඩිපුරම විලා හා රෙස්ටුරන්ට් පවත්වාගෙන යන ආකාරය දුටු බවත්, මාර්ගය දෙපස කාණු පද්ධතිය සම්පූර්ණයෙන් වැලි මඟින් අවහිරව ඇති නිසා වැසි දිනවල දී මාර්ගය ජලයෙන් යටවන බැවින් එම ජනතාවගේ ඉල්ලීම වූ ඉදිරි සංචාරක සමයට පෙර මෙම කාණු පද්ධතිය පිළිසකර කර දීම සුදුසු වන බවත්, එම වැසි ජලය බෙන්තර දුම්රියපළ අසලින් මුහුදට වැටෙන ලෙස සකසා තිබුණත් එම ස්ථානයේ ඇති බෝක්කුව කුඩා වීම නිසා ඒ හරහා නිසි ලෙස ජලය ගලා යාමක් සිදු නොවන බව ද නිරීක්ෂණය වූ බවත් සඳහන් කරන ලදී.

**ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය**

මෙම මාර්ගයේ කාණු පද්ධතිය මීට වසර 4 කට පමණ පෙර පසුගිය සභා කාලයේ දී එවකට සිටි තාක්ෂණ සේවා නිලධාරී රංග මහතා සම්බන්ධ කර ගනිමින් සුද්ධ කළ බවත්, එහි සමහර ස්ථානවල එම විලා හා හෝටල් අයිතිකරුවන් විසින් ගල් දමා කාණු පද්ධතිය අවහිර කර තිබූ බවත්, ඒවා ඉවත් කිරීමට ඔවුන් එම අවස්ථාවේ දී එකඟ නොවූ බවත්, නැවත එය සුද්ධ කිරීම ඉතාමත්ම හොඳ යෝජනාවක් බවත් සඳහන් කරන ලදී.

**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**

තාක්ෂණ සේවා නිලධාරීතුමන් හා වැඩ පරිපාලක මහතා සම්බන්ධ කර ගනිමින් එම කටයුතු සිදු කර ගන්නා ලෙස සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.5. ගරු මන්ත්‍රී, රංජිත් උබේසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා:-**

5.5.1. දෝපේ කොට්ඨාසයේ කහගල්ල ග්‍රාම නිලධාරී වසමේ රන්දාගොඩ පන්සල පාරේ ( කොන්ක්‍රීට් පාර) පන්සල අසල සිට ඇල්පිටිය පාර දක්වා දෙපස මීටර් 100 බැගින් කොටස් කාණු පද්ධතිය අවහිර වීම නිසා වතුර බැස නොයෑමෙන් පාරේ පැවැත්මට මෙන්ම මහජනතාව ද අපහසුතාවයට පත්ව ඇත. බැකෝ යන්ත්‍රය යොදා මෙම මාර්ගය දෙපස කාණු පද්ධතිය පිළිසකර කර දෙන ලෙස යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු මන්ත්‍රී, රංජිත් උබේසිංහ මැතිතුමා**

මෙම මාර්ගයේ කොටසක් පසුගිය දිනක ගිලා බැස එය සභාව මඟින් පිළිසකර කර දීම පිළිබඳ ස්තුතිවන්ත වන අතරම ඒ කොටස නැවත පිළිසකර කරත් එම ස්ථානයේ වතුර බැස නොයා රැඳී පැවතීම හේතුවෙන් නැවත නැවත ගිලා බැසීමට හැකියාව ඇති නිසා මාර්ගයේ දෙපස මීටර් 100 ක පමණ කොටස බැකෝ යන්ත්‍රය යොදවා සුද්ධ පවිත්‍ර කිරීමෙන් සිදු කළ ශ්‍රමයට යම් වටිනාකමක් ලබා ගත හැකි බවට විශ්වාස කරන බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.6. ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

5.6.1. නෙලුම්පොකුණගම බන්ගලාවත්ත පාරේ ජානක කන්නන්ගර මහතාගේ නිවස අසල සිට සරත් මහතාගේ නිවස දක්වා ඇති පැති කාණුව සකසා දීමට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය</u>**
මෙම මාර්ගයේ නිවෙස් දෙක අතර කොටසේ කාණු පද්ධතියක් නොමැති නිසා වැසි ජලය ගලා යාමට ස්ථානයක් නොමැති බැවින් බැකෝ යන්ත්‍රය යොදවා කාණු පද්ධතියක් සකස් කර දීම සුදුසු බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.7. <u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.7.1. පිටාරඹ පන්සල පසුකර වමට ඇති මාර්ගයේ රාජපක්ෂ මහතාගේ නිවස අසලින් ඉදිරියට ඇති කසුන් වලන මයාගේ හෝටලය දක්වා ඇති මාර්ගයට කොන්ක්‍රීට් අතුරා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.8. <u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.8.1. බෙන්තොට ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව සංවිධානය කරනු ලබන දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම් වැඩසටහනේ ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග ලබා දීමට CR පිටු 120 පොත් 830 ක් ලබා දෙන ලෙස ශාසනාරක්ෂක බල මණ්ඩලය හා බෙන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් ඉල්ලා ඇත. ඒ සඳහා සභා අරමුදල් දැරීමට දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2026.06.26 දිනැතිව පොදු අනුමැතියක් පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇත. ඒ අනුව ප්‍රාදේශීය සභාවේ අරමුදල් යොදවා CR පිටු 120 පොත් 830 මෙම සිසු නිපුණතා ඇගයීම් වැඩසටහන වෙනුවෙන් ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
කොමසාරිස් පාලන කාලයේ දී ආණ්ඩුකාරවරු විසින් ස්වාමීන් වහන්සේලාගේ ඉල්ලීම් ලබා දෙන ලෙස චක්‍රලේඛයක් නිකුත් කර තිබෙන නිසා විශාල වැය බරක් සභා අරමුදලින් දැරීමට සිදු වුවත් මෙය ලබා දීමට සිදු වන බව සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය</u>**

විශාල වැය බරක් දරා මෙම පොත් මිලට ගෙන ඒවා වෙන වෙනම පාර්සල් කොට ත්‍යාග ලෙස සකසා ලබා දුන්නත් පසුගිය වර්ෂවල ත්‍යාග හා සහතිකපත් ප්‍රදානෝත්සව වල දී මේ සඳහා දායකත්වය අප සභාවෙන් බවට කෙටි සඳහනක්වත් නොකළ බව සඳහන් කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

මෙවර ත්‍යාග සඳහා පාර්සල් කරන ලද පොත් ලබා දීමේ දී එහි කවරයේ බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය දායකත්වයක් බවට සඳහනක් කොට ලබා දීමට කටයුතු කරන ලෙස සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.2. 2026.08.04 දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභාවේ නිර්දේශ කරන ලද පහත ප්‍රාදේශීය සභා පෙර පාසල් 05 සඳහා බ්ලූටූත් ස්පීකර් (Bluetooth Speaker) යන්ත්‍ර ලබා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

1. මල්මඩුවාකන්ද පෙර පාසල
2. ඉඳුරුව පෙර පාසල
3. පියවර පෙර පාසල
4. දෝපේ පෙර පාසල
5. කුඩා ඌරගහ පෙර පාසල

එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.3. 2026.08.04 දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභාවේ නිර්දේශ කළ පරිදි එළඹෙන ඔක්තෝම්බර් 01 දිනට යෙදෙන ලෝක ළමා හා වැඩිහිටි දිනය නිමිති කොටගෙන ප්‍රාදේශීය සභා පෙර පාසල් 06 හි පූර්ව ළමාවිය සංවර්ධනයට යොමුව සිටින සිසු දරුවන් වෙනුවෙන් විනෝදකාමී අවස්ථාවන් සහිත වැඩසටහනක් පවත්වා ත්‍යාග ලබා දීමටත්, ඒ වෙනුවෙන් රු. 362,600/-ක මුදලක් සභා අරමුදලින් දැරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.4. ඉදිරි කාල සීමාව තුළ දී ශ්‍රී ලංකාවට ද බලපෑම් කරන බවට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අනාවැකි පළ කරන එල්නිනෝ නියං තත්ත්වයේ දී බල ප්‍රදේශයේ ජනතාවට ජල පහසුකම් සැපයීමට

ප්‍රයෝජනයට ගැනීම පිණිස ලීටර් 1000 ජල ටැංකි 03 ක් මිල දී ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.5. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට ඇති භාවිතයට නොගෙන නිශ්කාර්යව පවතින කුඩා ගොඩනැගිල්ල සුබ සාධක ආපනශාලාවක් ලෙස පවත්වාගෙන යාමට බෙන්තොට ප්‍රාදේශීය සභා සුබ සාධක සමිතිය මඟින් ඉල්ලා ඇත. එකී ගොඩනැගිල්ලේ පවතින සුළු අලුත්වැඩියාවන් සිදු කර තීරණය කරනු ලබන මාසික බදු මුදලක් සහ සුදුසු කොන්දේසි යටතේ සේවක සුබ සාධක සමිතිය වෙත ආපනශාලාවක් පත්වාගෙන යාම සඳහා එම ගොඩනැගිල්ල ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.6. 2026.07.30 දින පැවති පුස්තකාල උපදේශන කමිටුවේ නිර්දේශ කළ පරිදි 2026 වර්ෂය සඳහා බෙන්තොට ප්‍රාදේශීය සභා මහජන පුස්තකාල 06 සඳහා රු. 1,000,000.00 ක ග්‍රන්ථ මිල දී ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය</u>

මෙය සෑම වර්ෂයකම සිදු කරනු ලබන්නක් වන බවත්, මේ වන විට පාසල්වල බහුතරයක් ශ්‍රේණිවල විෂය නිර්දේශය වෙනස් වී ඇති නිසා පාසල් ළමුන්ගේ ඉල්ලීම් හා පාඨක සමාජයේ ඉල්ලීම් මත මෙවර පොත් මිල දී ගන්නට පසුගිය පුස්තකාල කමිටුවේ දී සාකච්ඡා වූ බවත්, නව විෂය නිර්දේශයන්ට අනුව සකසන ලද විභාග ප්‍රශ්න පත්‍ර ආදිය ද මේ සඳහා ඇතුළත් කර ගන්නා බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.7. ගෝනගල දොඹගහවත්ත ප්‍රධාන මාර්ගයේ ඇතැම් ස්ථාන ඉතා අබලන් වී ගමනාගමනයට අපහසු තත්ත්වයක පවතී. එම කොටස් පෙරමුසු යොදා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.8. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2026 යටතේ බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත පහත ප්‍රාදේශීය සභා මාර්ගවලට අදාළ සංවර්ධන යෝජනා සඳහා ප්‍රාදේශීය සභාවේ එකඟතාවය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී වසම | මාර්ගයේ නම | සංවර්ධනය කළ යුතු දුර (මීටර) | පළල (අඩි/ මීටර) | සංවර්ධන ක්‍රමවේදය (කොන්ක්‍රීට්/ කුට්ටිගල්/ තාර/ ඇස්පොල්ට්) | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | ඇස්තමේන්තුගත මුදල (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | | 3 ඒ බෝධිමළුව | සුදිල් ආනන්ද මහතාගේ නිවසේ සිට සෝමවතී ප්‍රනාන්දු මියගේ නිවස දක්වා | 125 | මී. 3.0 | කොන්ක්‍රීට් | 25 | 2,000,000.00 |
| 02 | | 3 බී සිංහරූපාගම | කෙත්තාරාම පන්සල පිටුපස ගේට්ටුව අසල සිට ශාන්ත මහතාගේ නිවස දක්වා | 100 | මී. 3.0 | කොන්ක්‍රීට් | 15 | 1,800,000.00 |
| 03 | බෙන්තොට | 6 දෙද්දුව | මහගෙදරවත්ත විලියම් ගුණරත්න මාවත කොටසක් (රංජිත් චන්ද්‍රසිරි මහතාගෙ නිවස අසල සිට එම්. ඒ. උපාලි ලයනල් මහතාගේ නිවස දක්වා) | 100 | මී. 3.0 | කොන්ක්‍රීට් | 20 | 1,800,000.00 |
| 04 | | 8 බී ඔලගන්දුව | ඔලගන්දුව වේල්ල පාර | 110 | මී. 2.45 | කොන්ක්‍රීට් | 40 | 1,500,000.00 |
| 05 | | 8 සී අතුරුවැල්ල | පොල්වත්ත පාර | 110 | මී. 2.45 | කොන්ක්‍රීට් | 16 | 1,500,000.00 |
| 06 | | 9 කයිකාවල | සිවුරු කඩේ ඉදිරිපස සිට සිරිනිවාස විලා දක්වා මාර්ගය | 100 | මී. 2.45 | කොන්ක්‍රීට් | 15 | 1,400,000.00 |
| 07 | | 9 ඒ ඇටවලවත්ත නැගෙනහිර | ඕකන්ද පාර | 135 | මී. 2.45 | කොන්ක්‍රීට් | 60 | 1,800,000.00 |
| 08 | | 11 ඕ දොඹගහවත්ත | අධිකාරිගොඩ පාර | 110 | මී. 2.45 | කොන්ක්‍රීට් | 7 | 1,500,000.00 |
| 09 | | 11 ඊ කොළණිය | එල්. ඩී. නිරෝෂන් මහතාගේ නිවස අසල සිට වටරවුම දක්වා | 125 | මී. 2.45 | කොන්ක්‍රීට් | 18 | 1,800,000.00 |
| 10 | | 14 සී මහවිල බටහිර | දංවත්ත පාර | 120 | මී. 2.45 | කොන්ක්‍රීට් | 25 | 1,500,000.00 |
| 11 | | 14 ඊ ඇතුංගාගොඩ | ඩී. එන්. වික්‍රමආරච්චි මාවත | 130 | මී. 3.0 | කොන්ක්‍රීට් | 200 | 2,000,000.00 |
| 12 | | 40 බී හිපන්වත්ත | පිට්ටනිය වටරවුම් පාර, සංජීව මහතාගේ නිවස අන්තය | 110 | මී. 2.45 | කොන්ක්‍රීට් | 30 | 1,400,000.00 |
| 13 | | 40 ඩී ඉහළ මාලවල | දැල්කඩ සිට ඉහළ මාලවල දෙසට (ක්‍රිෂ්ණ මහතාගේ නිවස සිට ඉහළ මාලවල දෙසට) | 150 | මී. 2.45 | කොන්ක්‍රීට් | 50 | 2,000,000.00 |
| | | | | | | | | 22,000,000.00 |

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.9. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මඟින් සලකා බලා සභාපතිවරයාගේ අනුමැතිය මත ගෙවීම් සඳහා මහ සභාව අනුමැතිය ලබා දුන් මූල්‍ය සීමාව රු. ලක්ෂ 15 කි. මේ වන විට ඇස්තමේන්තු අනුමත කිරීමේ සීමාව හා බිල්පත් ගෙවීම් සඳහා ප්‍රාදේශීය සභාවට අනුමත කළ හැකි මූල්‍ය සීමාව ද ඉහළ ගොස් ඇති බැවින් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මඟින් නිර්දේශ කරනු ලබන ගෙවීම්වලට අදාළව මහ සභාවේ ආවරණ අනුමැතියට යටත්ව සභාපතිවරයාට අනුමත කර ගෙවීම් කළ හැකි මූල්‍ය සීමාව රු. ලක්ෂ 20 දක්වා වැඩි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.10. දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2026/ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන/ වෙනත් සේවා ප්‍රතිපාදන හා සභා අරමුදල් යොදවමින් ඇස්තමේන්තුගත රු. 12,955,912.24 ක වටිනාකමකින් බෙන්තොට ප්‍රාදේශීය සභා ආදාහනාගාර භූමියේ ඉදි කිරීමට යෝජිත අවමංගල්‍ය උත්සව ශාලාව අදියර I ව්‍යාපෘතියේ සමාරම්භය වෙනුවෙන් සමරු ඵලකයක් ඉදි කිරීම මෙන්ම එහි සමාරම්භක උත්සවයේ කටයුතු වෙනුවෙන් රු. 50,000/- ක මුදලක් සභා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.11. අප සභාව මඟින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු සඳහා උපකාර වන මට්ටම් උපකරණය (Level Machine) ඇතුළු ඊට අවශ්‍ය 5M Staff හා Tripod උපකරණ මිල දී ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

අප සභාව මඟින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතුවල දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෝ වෙනත් ආසන්න ප්‍රාදේශීය සභාවක් මඟින් level machine එකක් ලබා ගනිමින් වැඩ කටයුතු සිදු කරන නමුත් මේ වන විට එම ආයතන මඟින් සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති ද ආරම්භ කර ඇති නිසා එම ආයතනවල උපකරණ පිටත ආයතනවලට දීමට නොහැකි තත්ත්වයක් මතුව ඇති බවත්, කඩිනමින් අප ආයතනයේ

පහසුව සඳහා level machine එක ඇතුළුව ඊට අදාළ අනෙකුත් උපකරණ මිල දී ගැනීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.12. පළාත් නිශ්චිත ප්‍රදාන - 2026 මූල්‍ය ප්‍රදාන යටතේ මහ ඉඳුරුව උඩුමුල්ල ප්‍රජා ජල ව්‍යාපෘතිය ඉදි කිරීමට අනුමත මූල්‍ය ප්‍රතිපාදන රු. මිලියන 20 කි. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් ජල විභවතාවය පරීක්ෂා කිරීමේ දී එම ග්‍රාමයේ නළ ළිඳක් ඉදි කිරීමට සුදුසු භූමියක් නොමැති බැවින් එකී ප්‍රතිපාදන කඩිනමින් යොදවා සංවර්ධන කටයුතු සිදු කිරීමට හා ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති යෝජනා මාර්ග සංවර්ධන යෝජනා ලෙස හෝ කඩිනමින් ඉටු කිරීමට පළාත් පාලන කොමසාරිස් උපදෙස් ලබා දී ඇති බැවින් එම ප්‍රතිපාදන යොදවා ගල්බඩ බණ්ඩාරනායක මාවත ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.13. ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා සිදු කිරීමට නියමිත පහත සඳහන් කර්මාන්තවලට අදාළ ඇස්තමේන්තු පිළිගෙන සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | මාර්ගයේ/ කර්මාන්තයේ නම | ඇස්තමේන්තුගත මුදල (රු.) |
|---|---|---|
| 01 | ඇටවලවත්ත නැගෙනහිර පටුමඟ කොන්ක්‍රීට් කිරීම | 1,000,082.23 |
| 02 | අංක 11 C ගලගම ග්‍රාම නිලධාරී වසමේ ගලගම රෝහල ඇතුළු ගෝනගල මිරිස්වත්ත ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන ගලගම මුල්ලෙගොඩ මාර්ගයේ ඉතා අබලන් තත්ත්වයේ පවතින මාර්ග කොටස තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීම. | 401,741.67 |
| 03 | පිටාරඹ පන්සල පසුකර වමට ඇති මාර්ගයේ රාජපක්ෂ මහතාගේ නිවස අසලින් ඉදිරියට ඇති කසුන් වලන මයාගේ හෝටලය දක්වා ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 756,160.85 |
| 04 | ගෝනගලපුර පොදු වෙළඳ සංකීර්ණයේ පළමු මහලේ කඩ කාමර 11 ක් ඉදි කිරීම (අමාත්‍යාංශය විසින් ලබා දීමට නියමිත ප්‍රාග්ධන ප්‍රදානය - රු. 15,000,000.00/ සහා මූල්‍ය දායකත්වය - රු. 5,016,815.60) | 20,016,815.60 |
| 05 | ඇටවලවත්ත නැගෙනහිර පාසල අසල චන්දන මහතාගේ නිවස ඉදිරිපස ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 761,544.63 |

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දුෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.9.** <u>**ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-**</u>

5.9.1. හිපන්වත්ත පොදු සුසාන භූමිය JCB යන්ත්‍රය යොදා සුද්ධ පවිත්‍ර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා</u>
සිල්වර්පොයින්ට් හි ජනතාවට පර්චස් 10, 20 ප්‍රමාණ පමණක් තිබෙන නිසා ඉදිරියේ දී මෙම සුසාන භූමිය භාවිතයට ගැනීමට සිදු වන බවත්, පසුගිය දිනක දේහයක අවසන් කටයුතු කිරීමට මෙම සුසාන භූමිය යොදා ගැනීමට උත්සහ කළ ද ගස් වැවී ඇති නිසා එය තුළට ගමන් කිරීමට නොහැකි වූ නිසා නිල සෙවන පවුලේ සුසාන භූමියේ එම මෘත දේහයේ අවසන් කටයුතු කිරීමට සිදු වූ බවත්, කඩිනමින් සුසාන භූමිය සුද්ධ පවිත්‍ර කොට සභාවේ නීති රීතිවලට අනුකූලව මෘත දේහ තැන්පත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.9.2. දෙල්කබලගොඩ කල්ලම් එක උඩ පාරේ කැකිරිගත්හේන පාර දෙපස මතුවී ඇති කාණු පද්ධතියේ කැටලීම හා දෙපස සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් වමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා</u>
මෙම මාර්ගය දෙපස අවහිර වී ඇති කාණු හා බෝක්කු පද්ධති සුද්ධ පවිත්‍ර කර දීම සුදුසු බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.9.3. හිපන්වත්ත ප්‍රධාන පාර JCB යන්ත්‍රය යොදා සුද්ධ පවිත්‍ර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් වමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා</u>

මේ වන විට හිපන්වත්ත පාර පස් දමා සංවර්ධනය කරලා තිබෙන බවත් එය ප්‍රධාන පාරක් නිසා සභාවේ සම්පත් යොදවා සකස් කරලා දීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.9.4. රත්හේන සිට කොටකිලල පාර පස් දමා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.10.** **<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.10.1. දකුණු පළාතට පිවිසෙන දොරටුව සේම සංචාරක නිකේතනයක් වන බෙන්තර පාලම අසල බෝවිටියා මල තිබෙන ස්ථානය පිරිසිදුව සුන්දරව පවත්වා ගැනීම සඳහා සභාවේ කම්කරුවන් කීප දෙනෙකු යෙදවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>
පසුගිය දිනක රන්තොටුවිල පාසලේ දරුවන් පිරිසක් බෙන්තරට විශාල ජයග්‍රහණයක් ගෙන ආ බවත්, ඒ වගේම ගෝමටේ ධර්මපාල විදුහලේ දරුවන් ද ප්‍රදේශයේ ප්‍රධාන පාසල් අභිබවා විශාල ජයග්‍රහණ කිහිපයක් ලබාගත් බව පසුගිය දිනවල දැන ගැනීමට ලැබුණු බවත්, ඒ සියලු දරුවන්ට තම සුභ පැතුම් එක් කරන අතර, රන්තොටුවිල පාසලේ දරුවන් පිළිගැනීම වෙනුවෙන් පසුගිය දිනක සභාපතිතුමා, ලේකම්තුමා මෙන්ම මා ඇතුළු තවත් සහෝදර මන්ත්‍රීවරු කීප දෙනෙක් ද සහභාගී වූ උත්සවයක් බෙන්තර පාළම අසල බෝවිටියා මල අසල දී පැවැත්විණ. ක්ෂණිකව උත්සවය සංවිධානය කර තිබූ නිසා එම ස්ථානය පිරිසිදු කර නොතිබූ බවත්, පෙර දැනුම් දීමක් සිදු කළා නම් එම ස්ථානය පිරිසිදු කර දීමට හැකියාවක් තිබුණු බවට ද සභාපතිතුමා පැවසූ බවත්, එම ස්ථානය දකුණු පළාතට පිවිසෙන ස්ථානය මෙන්ම සංචාරක නිකේතනය නිසා එහි සුන්දරත්වය, පිරිසිදු බව පිළිබඳ අවධානය යොමු කොට එහි කටයුතු සඳහා කම්කරුවන් කීප දෙනෙක් යෙදවීම හෝ පුද්ගලික ආයතනයක් මඟින් පිරිසිදු කිරීම් සිදු කරවා ගැනීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී. ඒ වගේම බෝවිටියා මල අසල රෝපණය වෙමින් පවතින කාක බෝධිය සභාවට ආදායමක් ලැබෙන ආකාරයට සකසා ගැනමේ හැකියාවක් පවතින බවත්, එම ස්ථානයේ පිං කැටයක් තබා පඩුරු දැමීමට සංස්කෘතියක් ඇති කළේ නම් ඒ මඟින් සභාවට ආදායමක් ලබා ගැනීමට හැකියාව පවතින බවත් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

ආකර්ශනය මෙන්ම ආදායමක් උත්පාදනය කර ගැනීමට හැකියාවක් ඇති නාගරික සංවර්ධන අධිකාරියෙන් අප හට පවරා දී ඇති මෙම ස්ථානයේ අම්බලන්ගොඩ සේ හෙළ බොජුන් හළක් ඉදි කරන්න යෝජනා කළා. බොජුන් හළ ඉදි කරන්න පුළුවන්. නමුත් වාහන නතර කර තියන්න තැනක් නෑ. මේ වන විට නාගරික සංවර්ධන අධිකාරියෙන් සැලසුම් 02 ක් ඇඳලා දීලා තියෙනවා. තාක්ෂණ සේවා නිලධාරීතුමාට භාර දීලා තියෙන්නේ පුළුවන් ඉක්මනට ඇස්තමේන්තු හදලා දෙන්න. ඊට අමතරව පාලම් 02 අතර තියෙන කන්ටේනර් බොක්ස් 02 ත් අපට පවරලා දීපු එකක්. ඒකත් පාවිච්චි කරලා කඩ 03 ක් හදලා මේ ප්‍රදේශයේ ව්‍යාපාරිකයෝ 03 දෙනෙකුට ලබා දෙන්න තමයි අදහස් කරන්නේ. දැනටත් එතන හවසට කට්ටිය ඇවිත් වාඩිවෙලා ඉන්නවා. අපිට තියෙන්නේ නඩත්තු කරන්න විතරයි. එම ස්ථානයේ දෙපැත්තේ ඉවුරු 02 අපට අයිති නෑ. ඔය කැළේ වැවෙන්නේ අපි හින්දා නෙවෙයි ඇත්තටම. අපිට තියෙන්නේ කොන්ක්‍රීට් කරලා තියෙන කොටස අතුගාන්න විතරයි. දෙපැත්තේ මාන ගස් හැදෙන කොටස වාරි මාර්ගයට හා දුම්රිය දෙපාර්තමේන්තුවටයි අයිති. එතන ඔය ඉදි කිරීම කරන කොට ඒ අයට කියන්න ඕනේ දෙපැත්තේ පොඩි වැටක් ගහලා මල් වවන්න පුළුවන් විදිහට හරි හදලා දෙන්න කියලා. නැතුව ඒ අය මල් වවන්නේ නෑ. ලොකු ඉදි කිරීමක් කරන්නත් බෑ. අවට තියෙන සුන්දරත්වයට හානි නොවෙන්න, දුම්රිය පාර හා බුදු පිළිම වහන්සේ පේන විදිහට තමයි ඉදි කිරීම කරන්නේ. අපේ තියෙන සේවක ප්‍රශ්නයත් එක්ක එම ස්ථානය හැමදාම පිරිසිදු කරන්න බෑ. අපි කරන්නේ එතන මොකක් හරි උත්සවයක් තියෙනවා නම් ඊට කලින් දවසේ ගිහින් සුද්ධ පවිත්‍ර කර දීම බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය</u>

කොඩිතුවක්කු මන්ත්‍රීතුමා කියන ස්ථානය සම්බන්ධයෙන් සංචාරක නිකේතන නිලධාරී වෙත උප සභාපතිතුමා කළ ඉල්ලීමකට අනුව ඔවුන් භාරගෙන තිබුණා සතියට දින 02 ක් එම ස්ථානය පිරිසිදු කරන්න. ඒ නිසා නැවත ඒ පිළිබඳ එතුමියට මතක් කිරීමක් සිදු කිරීම සුදුසු බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.12. <u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.12.1. තුඩුව සිට පියද්ද හරහා ඇලකාක මාර්ගය දෙපස JCB යන්ත්‍රය මඟින් පිරිසිදු කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>

මෙම මාර්ගය හබුරුගල, සූරියගම ළමුන් බහුලව භාවිත කරන මාර්ගයක්. ඒ වගේම ඇලකාක සිට හබුරුගල මහා විද්‍යාලයට එන සිසුන් ද භාවිත කරන පාරක්. එම මාර්ගයේ කොටස් 02 ක් තියෙනවා කොන්ක්‍රීට් කරලා උස්සලා. එතනින් එහාට තියෙන ටිකේ වතුර පිරෙනවා. බහින්නේ නෑ. පාර පුරාම වතුර. සාමාන්‍ය පොඩි වැස්සකට පවා අඩි ½ ක් විතර උසට වතුර පිරෙනවා. ළමයෙකුට පාරේ යන්න බෑ. මෝටර් බයිසිකලයකින්වත් යන්න බෑ. ඒ නිසා එම ස්ථානය සකස් කර දීම සුදුසු බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.12.2. බෙන්තොට ප්‍රාදේශීය සභාවට අයත් හබුරුගල ක්‍රීඩා පිටිය JCB යන්ත්‍රය යොදා සමතුලිත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>
හබුරුගල ධර්මරාජ විද්‍යාලය අසලම පවතින මෙම පිට්ටනිය මේ වන විට වතුර වලක් බවට පත් වී තිබෙන බවත්, JCB යන්ත්‍රය මඟින් එම වතුර පැත්තකට ගලා බැස යන ආකාරයට සකස් කර දීමට කටයුතු කරන ලෙසත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.12.3. හබුරුගල අන්දු බෝක්කුව දෙපස සෝලර් ලයිට් 02 ක් සවි කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.12.4. දෙද්දුව මහගෙදරවත්ත විලියම් ගුණරත්න මාවත ආරම්භ කරන ස්ථානයේ ඇති කැඩී ගිය බෝක්කු ඉහළ කොටස ඉවත් කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>
මේ වන විට එම ස්ථානයේ බෝක්කුවක් නොමැති බවත්, එහි උඩ කොටස පමණක් ඇල්පිටිය මාර්ගයට අවහිරයක්ව මාර්ගය අයිනේ පවතින බවත්, එය ඉවත් කිරීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.13.** **<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.13.1. සභා බල ප්‍රදේශයට අයත් අංක 40 ඩී ඉහළ මාලවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අබලන් මාර්ග (බොරළු මාර්ග) ප්‍රතිසංස්කරණය කිරීම සභාවේ බැකෝ යන්ත්‍රය යොදවා (දින දෙකක්) සිදු කර දෙන මෙන් සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
මෙය ප්‍රණාන්දු ශ්‍රීලාල් මන්ත්‍රීතුමාගේ කොට්ඨාසයට අයත් වන බවත්, ගිය වර්ෂයේ ද මේ සඳහා යෝජනා ඉදිරිපත් කළ නමුත් මේ මාර්ග සඳහා මෙතෙක් අවධානය යොමු වී නොමැති බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.13.2. හදිසි අවශ්‍යතා සඳහා වරිපනම් අයිතිය පැවරීම සඳහා අවශ්‍යව ඇති පුරවැසියන් වෙනුවෙන් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය කල් නොතබා කර දීමට සුදුසු ක්‍රමවේදයක් ඇති කරන ලෙස සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
හදිසි අවශ්‍යතා සඳහා වරිපනම් පවරා ගැනීම් සිදු කර ගැනීමට අවශ්‍ය පුද්ගලයින් සිටින නමුත් මේ දිනවල තක්සේරු ප්‍රතිශෝධනයක් සිදුවන නිසා මාස 03 කින් පමණ එම කටයුතු කල් යන බව දැනුම් දී ඇති බවත්, ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් එය කල් නොදමා සිදු කළ හැකි ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරන ලෙසත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 11.13 ට මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

<u>කාරක සභා අවස්ථාව</u>

<u>ආදායම් පරීක්ෂක, බී. එන්. ඩී. උපාලි මහතා</u>
මේ දිනවල සිදුවන තක්සේරු ප්‍රතිශෝධන කටයුතු හේතුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දැනුම් දීලා තියෙනවා මාස 03 ක් යනතෙක් වරිපනම් සංශෝධනය කරන්න ඒ වී ෆෝම් භාර ගන්න එපා කියලා. වීථි රේඛා සහතික නම් නිකුත් කරන්න කියලා දැනුම් දීලා තියෙනවා. මේ දිනවල තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සියලු දෙනා මෙහේ ඉන්න නිසා එම ආයතනයේ ලිපිගොනුවල වැඩ කරන්න විදියක් නොමැති බව සඳහන් කරන ලදී.
<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මෙහෙ ඉන්න නිසා ඒ කාර්යාලයේ වැඩ කරන්න විදිහක් නැහැ. ඒ නිසා එම තක්සේරු කටයුතු අවසන් වන තෙක් කල් දමා ඇති බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
එහෙම තීරණයක් අරන් තියෙනවා නම් කරන්න දෙයක් නෑ. මම දන්නෙ නෑ. මට කතා කිරීමේ අයිතිය දෙන්න.

- මෙම අවස්ථාවේ දී සභාව මඳක් ඝෝෂාකාරී විය.

  - මෙම අවස්ථාවේ දී කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 11.15 ට කාරක සභාව නැවත මහ සභාව බවට පත් විය.

<u>මහ සභාව</u>

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.13.3. බෝධිමළුව ශ්‍රී සෝනුත්තර මාවත වැස්සට යටවීම වැළැක්වීම සඳහා දෙපස කාණු පද්ධතිය හාරා ප්‍රතිසංස්කරණය කරන ලෙස යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.14. <u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.14.1. ඇටවලවත්ත බටහිර පාසල අසල චන්දන මහතාගේ නිවස ඉදිරිපස ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.15. <u>ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.15.1. තොටකනත්ත වසමේ තොටකනත්ත සිට ගිනිගලවත්ත හරහා ඇලකාක වසමට වැටෙන මාර්ගය දෙපස ගස් අතු කපා පිරිසිදු කිරීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ප්‍රනාන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා</u>
මෙම මාර්ගය දෙපස ගස් අතු පාරට බරව පැවතීම නිසා සුද්ධ පවිත්‍ර කිරීමේ අවශ්‍යතාවයක් තිබෙන බවත් සභාවේ බැකෝ යන්ත්‍රය යොදා එය ඉටු කිරීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.16. <u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.16.1. මහගොඩ ගමගෙවත්ත මාර්ගයේ කැඩී ඇති අඩි 10 ක පමණ කොටස නැවත කොන්ක්‍රීට් යොදා සකසා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.16.2. හොරවල පන්සල පාර අඩි 30 ක් පමණ කොන්ක්‍රීට් කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.16.3. හොරවල පාසල මාර්ගය කෙළවර දිලීප් මහතාගේ නිවස අසලින් වතුර අනෙක් පසට බැස යාමට කුඩා බෝක්කුවක් යෙදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.16.4. මහගොඩ ග්‍රාමසේවා වසමේ කළු මහත්තයාගේ වත්ත පාර පළමු පටුමග බැකෝ යන්ත්‍රය යොදා පිළිසකර කර දීමට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.16.5. සභා ගර්භය වායු සමීකරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.17. ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-**

5.17.1. බෙන්තොට ප්‍රාදේශීය සභාව මඟින් පාලනය වන පෙර පාසල් 6 සඳහා ජල පෙරණ (ෆිල්ටර්) ලබා දීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් වමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.17.2. පුරෝකතනය කර ඇති එල්නිනෝ තත්ත්වයට පිළියම් යෙදීම සඳහා ගරු සභාපතිතුමාගේ සහභාගීත්වයෙන් කමිටුවක් පත් කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.17.3. වියන්දූව වත්ත වොලිබෝල් පිටිය අසලින් ඇති මාර්ගයේ කාණුව සකස් කර දීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.18.** **<u>ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.18.1. බෙන්තොට, මිරිස්වත්ත, පිලේකුඹුර ලිපිනයේ පදිංචි ගිනිගල්ගොඩගේ වජිර සමන් කුමාර (ජා. හැ. අ. 793291531V) යන අය විසින් තමාට අයත් යාලගම බෝධිනාගොඩ අංක 1910 ඔප්පුවට අදාළ ඉඩමෙන් කොටසක් ස්ව කැමැත්තෙන් අප සභාවට ගමවාසීන්ට මාර්ගයක් පුළුල් කර ඉදි කර දීම වෙනුවෙන් පවරා ලබා දීමට එකඟතාවය පළ කර ඇති බැවින් එම පරිත්‍යාග කරනු ලබන ඉඩම් කොටස යොදාගෙන යාලේගම, බෝධිනාගොඩ නිවාස කිහිපයකට යාමට ඇති මාර්ගය පුළුල් කර සභාව මඟින් සංවර්ධනය කර දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**6. කාරක සභාවල වාර්තා සලකා බැලීම :-**

6.1. 2026.06.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව

6.2. 2026.06.23 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව

6.3. 2026.07.03 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව

6.4. 2026.07.09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව

6.5. 2026.07.10 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව

6.6. 2026.07.22 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව

ඉහත කමිටු වාර්තා පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**7. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ වාර්තා සහ වෙනත් ලේඛන සභාවට ඉදිරිපත් කිරීම හා සලකා බැලීම :-**

**7.1. 2026 ජූලි මස ලැබීම් හා වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.**

2026 ජූලි මස ලැබීම් හා වියදම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

| 2026 ජූලි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය | |
|---|---|
| පුනරාවර්තන ආදායම් එකතුව | රු. 41,123,705.54 |
| එකතු කළා මූලධන ලැබීම් :- | - |
| පුනරාවර්තන හා මූලධන ලැබීම්වල එකතුව | **රු. 41,123,705.54** |
| සේවක ණය | රු. 466,833.16 |
| තැන්පත් | රු. 569,900.00 |
| දේපළ ණය පොළී | රු. 10,766.60 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 206,850.00 |
| බලපත්‍ර බදු | රු. 12,950.00 |
| වැටුප් හා වවුචර් මුද්දර බදු | රු. 3,500.00 |
| 101 ට බැර | රු. 35,669.50 |
| 201 ට බැර | රු. 77,935.88 |
| 301 ට බැර | රු. 69,243.37 |
| 601 ට බැර | රු. 35,727.09 |
| 104 ට බැර | රු. 8,800.00 |
| එකතුව | **රු. 42,621,881.14** |
| 2026 ජූලි මස ඒකාබද්ධ වැය සාරාංශය | |
| පුනරාවර්තන වියදම් එකතුව | රු. 14,173,313.58 |
| එකතු කළා -ප්‍රාග්ධන වියදම් | රු. 470,587.37 |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වැයවල එකතුව | **රු. 14,643,900.95** |
| දේපළ ණය පොළී | රු. 10,652.29 |
| තැන්පත් | රු. 1,192,032.92 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 42,620.00 |
| සේවක ණය | රු. 919,300.00 |
| මුද්දර බදු | - |
| ණය හිමියෝ | රු. 22,265.27 |
| එකතුව | **රු. 41,830,771.43** |

**7.2. 2026.07.31 දිනට බැංකු සැසඳුම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.**

2026.07.31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගිණුම් අංක 2758780 දරන පොදු ජංගම ගිණුම, ගිණුම් අංක 2759057 දරන කර්මාන්ත ජංගම ගිණුම හා ගිණුම් අංක 81618288 දරන සේවක ණය ජංගම ගිණුම යන බැංකු ගිණුම්වලට අදාළ බැංකු සැසඳුම් වාර්තා ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

**7.3. 2026.07.31 දිනට හිඟ ආදායම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.**

2026.07.31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

| ආදායම් ශීර්ෂය | | බෙන්තොට/ඉඳුරුව/හබුරුගල |
|---|---|---|
| 1. | වරිපනම් බදු | රු. 8,694,263.16 |
| 2. | අක්කර බදු | රු. 191,448.00 |
| 3. | 1 % බදු | - |
| 4. | කර්මාන්ත /ව්‍යාපාර බදු | රු. 13,850.00 |
| 8. | වෙළඳ ස්ථාන කුළී | - |
| 10. | වෙළඳ බලපත්‍ර ගාස්තු | රු. 2,000.00 |
| 12. | ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු | රු. 2,950.00 |
| | **එකතුව** | **රු. 8,904,511.16** |

**8. වෙනත් කරුණු**

**8.1.** <u>ටෙන්ඩර් හා මිල ගණන්</u> **:-** නැත

**8.2.** **ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීම :-**

**ගරු මන්ත්‍රී, නිශාන්ත කුමාර මැතිතුමා**

ගලගම ජල ව්‍යාපෘතිය සම්බන්ධව නිරීක්ෂණ වාර්තාවක් තැපැල මඟින් යොමු කළ බවත්, ඊට පෙර 14 වෙනිදා රැස්වීම් වාර්තාවේ සඳහන් වූ දෑ පිළිබඳ නැවත මතක් කිරීමක් සිදු කරන බවත්, ඉන් පළමු වැන්න වූ ප්‍රජා ශාලා ඉඩම අයිතිය හා මහජන විරෝධතා මත තෝරා ගැනීමෙන් ඉවත්කර තිබෙන අතර, ඊළඟට ගලගම පන්සල් භූමියේ සිදු කළ ජල පරීක්ෂාවේ ප්‍රමාණවත් ජල විභවයක් නොමැති වීම හා උපකරණ ඒ ස්ථානයට ගෙන යාමට නොහැකි වීම නිසා එම ස්ථානය ද ඉවත් කර තිබේ. ඉන්පසු රාජ්‍ය නිලධාරීන් හා ජනතාව එකතු වී පවත්වන ලද රැස්වීමේ දීත් ස්ථානයක් සොයා ගැනීමට නොහැකිව ඇත. ඊළඟට කැමති අයගේ ඉඩම්වලට දුර ප්‍රමාණයක් සඳහන් කර තිබුණා දුර ප්‍රමාණය වැඩි බව දක්වා. ඒ ජල ටැංකියට ද නැත්නම් ජලය ලබා දෙන ගෙවල්වලට ද යන්න පැහැදිලි නෑ. භූමි ප්‍රදේශයක් ලැබුණොතින් මේ වසරේ දී එම ජල ව්‍යාපෘතිය ඉටු කර දීමට ඔබතුමා සඳහන් කර තියෙනවා. ඒ අනුව ඔබතුමා වෙත ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ වාර්තාව මම කියන්නම්.

ගලගම ග්‍රාම සේවා වසම තුළ ප්‍රජා ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළව ළිඳක් කැණීමට හා ජල ටැංකියක් ඉදි කිරීමට සුදුසු ස්ථාන සොයා බැලීම සඳහා 2026.08.02 දින කරන ලද නිරීක්ෂණයට අදාළ වාර්තාව

2026.08.02 ඉරිදා දින පස්වරු 3.15 ට පමණ ඉඳුරුව ගලගම පදිංචි එස්. ජී. දයානන්ද, ජී.ඒ. සුනේත්‍රා ජයවර්ධන, එච්. එච්. කාන්ති යන මහත්ම මහත්මීන් සමඟ එම අයගේ මඟ පෙන්වීම යටතේ ගලගම ග්‍රාම සේවා වසම තුළ ඉහත කාර්යය ඉටු කර ගැනීමට සුදුසු ස්ථාන තුනක් පරීක්ෂා කරන ලදී.

ස්ථාන අංක 01 - ගලගම දංගෙවත්ත යන ස්ථානයට යන මාර්ගයේ මාර්ගය ආසන්නයේම පොදු ළිඳක් තිබී ඇති අතර එම ළිඳ එවකට සමෘද්ධි ව්‍යාපාරය යටතේ ස්ථාපිත කර පවත්වාගෙන ගොස් ඇත. සාර්ථක ජල පෝෂකයක් යටතේ පවත්වාගෙන යන ලද මෙම ළිඳ පාළුවට ගොස් ඇත්තේ ක්‍රමිකව ප්‍රදේශවාසීන් තම තමන්ගේ නිවෙස්වල ළිං තනාගෙන භාවිතා කරන නිසාවෙනි. මෙම ළිඳ තරමක් ගොඩ වී ඇති අතර ප්‍රජා ජල ව්‍යාපෘතියට අදාළ ළිඳ කැනීම සිදුකිරීම සඳහා මෙම ස්ථානය සුදුසු බව ප්‍රදේශවාසීන්ගේ මතයයි. මෙම ස්ථානයේ සිට ජල ටැංකිය ඉදි කිරීමට සුදුසු මෙන්ම ටැංකිය ඉදි කිරීමට ඉඩ ලබාදෙන ස්ථානයට ඇති දුර ප්‍රමාණය මීටර් 150 ක් පමණ වේ. මෙම ස්ථානවල අදාළ ප්‍රජා ජල ව්‍යාපෘතිය ඉදි කිරීමට යෝජනා කරමි.

ස්ථාන අංක 02 - ගලගම විහාරස්ථානය පිටුපස ප්‍රදේශය ළිඳක් කැනීම සඳහා විහාරාධිපති හිමියන් විසින් ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර ඔබ විසින් කරන ලද මුල් පරීක්ෂාවේ දී ළිඳ කැනීම සඳහා එම ස්ථානයට යන්ත්‍ර සූත්‍ර ද සමඟ යාමට අපහසු බව ප්‍රකාශ වුව ද ඊට විකල්පයක් ලෙස යාබද ඉඩමේ පදිංචි රංජිත් මහතා විසින් ඔහුගේ ඉඩම හරහා එම යන්ත්‍ර සූත්‍ර ගෙන යාම සඳහා වාහනයක් ගමන් කිරීමට කැමැත්ත ප්‍රකාශ කරන ලදී. එම නිසා ඉහත අංක 01 ස්ථානයේ නොහැකි නම් විහාරස්ථානය පිටුපස ළිඳ ඉදි කිරීමට යෝජනා කරමි.

ස්ථාන අංක 03 - ගලගම රුහුණුගෙවත්ත පාරේ කිරිමැටි පාත්තිය නමැති පොදු ඉඩම තුළ මේ වන විටත් නිවාස කිහිපයක ජනතාව පොදු ළිඳක් මඟින් ජලය ලබා ගන්නා අතර ඉහත අංක 02 ස්ථානයේ නොහැකිනම් කිරිමැටි පාත්තිය නමැති පොදු ඉඩම තුළ පිහිටි එම ළිඳ සකස් කිරීමෙන් හෝ එම ස්ථානයේ වෙනත් ළිඳක් සකස් කිරීමෙන් අදාල ප්‍රජා ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

විශේෂයෙන්ම කිව යුතු කරුණ වන්නේ ඉහත ස්ථානවල අදාළ ප්‍රජා ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි හේතු තිබේ නම් ඒ බවට නියමිත පරීක්ෂණ නිලධාරීන් ලවා ලිඛිත වාර්තා ලබා ගත යුතු බව ප්‍රදේශවාසීන්ගේ මතය වී ඇති බවය.

කරුණු එසේ හෙයින් මෙම ස්ථාන පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කොට අදාළ ප්‍රජා ජල ව්‍යාපෘතිය ඉදිකිරීමට සුදුසු ස්ථානයක් තෝරා ගෙන එම කටයුත්ත ඉටුකර දෙන ලෙස කාරුණිකව මෙයින් ඉල්ලා සිටිමි.

මෙම නිරීක්ෂණ වාර්තාවට අමතරව ඔබතුමා මේ සම්බන්ධව පරීක්ෂා කරනවා නම් දින දෙකකට පෙරවත් මාව දැනුවත් කරන ලෙසත්, මේ පිළිබඳ ගලගම ජනතාව දැනුවත් කර ස්ථිර තීරණයක් ගැනීමට යෝජනා කරන බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා</u>**

රන්තොටුවිල විදුහලේ උත්සවය වෙනුවෙන් නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා, අප සභාවේ සභාපතිතුමා ඇතුළු සහෝදර මන්ත්‍රීවරුන් කීප දෙනෙක් ද සහභාගී වුණා. තාරක මන්ත්‍රීතුමා හා නිලුපුල් මන්ත්‍රීතුමා වාහන සපයා අනුග්‍රහය දැක්වූවා. ප්‍රාදේශීය සභාව විදියට ඔබතුමත් කාර්ය මණ්ඩලයත් දැක් වූ සහයෝගයට ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම බෝවිටියා මල අසල බිමට අල්ලා ඇති කැටගල් ගැලවී යාමට පටන් ගෙන ඇති බවත් එය මුල් අවස්ථාවේම ප්‍රතිසංස්කරණය කළොත් අඩු වියදමක් දරා නැවත සකස් කල හැකි වන බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>**

එල්නිනෝ තත්ත්වයට මුහුණ දීම සඳහා වතුර ටැංකි මිල දී ගැනීමට යෝජනාවකුත් මෙම සභාවට ඉදිරිපත් වුණා. බෙන්තර බල ප්‍රදේශය පුරා ප්‍රාදේශීය සභාව මඟින් නඩත්තු කළ යුතු පොදු ළිං ප්‍රමාණයක් තියෙනවා. ඉදිරියේ දී මෙම කාලගුණික තත්ත්වය හමුවේ ජල ප්‍රශ්නය උග්‍ර වෙන්න පුළුවන්. ඒ නිසා මෙම පොදු ළිං සුද්ධ පවිත්‍ර කර තබා ගැනීම සුදුසු වන බවත්, ඒ වගේම මීට පෙර මා ඉදිරිපත් කරන ලද යෝජනාවල් කීපයක් තිබුණා. ඒ අතරින් හබක්කල කන්ද පහළ ප්‍රදේශය ඔබතුමා විසින් සකස් කරන බව කීවත් ඒකේ මේ වෙනකොට ගල් ටික විතරයි ඉතුරුවෙලා තියෙන්නේ කොන්ක්‍රීට් එක උඩින් තාර දාපු හින්දා. එම ස්ථානය සහ සමිත මන්ත්‍රීතුමාගෙ නිවසට පිවිසෙන ස්ථානයේ හෙට්ටිගොඩ මාවතයි කඩිනමින් පිළිසකර කිරීම සුදුසු වන බව නැවත මතක් කිරීමක් සිදු කරන බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, නිශාන්ත කුමාර මැතිතුමා</u>**

පොදු ළිං ප්‍රතිසංස්කරණය කිරීම යටතේ ඔලගන්දුව ඉදුරුව රජයේ රෝහලට ආසන්නයේ ද පොදු ළිඳක් පවතින බවත් එහි වතුර ඉතාමත්ම පිරිසිදු නමුත් මේ වන විට ජනතාව භාවිත නොකරන බවත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 11.25 ට ගරු මන්ත්‍රී බී. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා ගරු සභාවෙන් පිටව යන ලදී.

**<u>ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා</u>**

සංදේශ පෙත්සම් අවස්ථාවේ දී ඉදිරිපත් කරන ලද යාලේගම, බෝධිනාගොඩ ප්‍රදේශයේ මාර්ගය සම්බන්ධව කරුණු දැක්වීමට මෙම අවස්ථාව යොදා ගන්නා බවත්, පසුගිය දිනක එම මාර්ගයේ නිවසක සිදු වූ මරණයක් සඳහා මා සහභාගී වූ විට එම ප්‍රදේශවාසීන් විසින් මෙම මාර්ගය පුළුල් කර දෙන ලෙස ඉල්ලීමක් සිදු කළ බවත්, එම මරණය පවා පටු මාවතේ ගෙනයාම ඉතාම අපහසු වූ බවත්, ඒ පිළිබඳව එම අවස්ථාවේම ගරු සභාපතිතුමන් දැනුවත් කළ විට මාර්ගය සකස් කර දීමට පොරොන්දු වූ නමුත් ඒ අවට ඉඩම්වල ගැටලුවක් පැවති නිසා අසල ඉඩමේ අයිතිකරුගෙන් ඒ පිළිබඳ විමසීමක් කළ බවත්, ඉතාම නිහතමානී පුද්ගලයෙකු වූ එතුමා තම ඉඩමෙන් කොටසක් මාර්ගය පුළුල් කිරීමට ලබා දීමට එකඟ වූ බවත්, ඒ අනුව එතුමා විසින් ලිපියක් සකස් කොට ග්‍රාම නිලධාරීතුමිය ඉදිරියේ අත්සන් කොට තම වටිනා ඉඩමෙන් කොටසක් ලබා දීමට එකඟවන බවට ලිඛිතව දැනුම් දුන් බවත්, ඒ වෙනුවෙන් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ස්තුතිය මේ අවස්ථාවේ දී පුද කරන බවත්, ඒ වගේම ඒ වෙනුවෙන් කැපවීමෙන් වැඩකටයුතු කළ ග්‍රාම නිලධාරීතුමියට ද ස්තුතිවන්ත වන බවත්, ඉඩමේ එම ලබා දීමට එකඟ වූ කොටසේ ගස් කීපයක් පවතින නිසා බැකෝ යන්ත්‍රය මඟින් එම ගස් ඉවත් කර දෙන ලෙසත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා</u>**

ගරු උප සභාපතිතුමාගේ යෝජනාවක් ලෙස පසුගිය දිනක වියන්දූව, කිරලගහවෙල මාර්ගය සභාවේ කම්කරු මහතුන් යොදා ඉතාම හොඳට සුද්ධ පවිත්‍ර කිරීම සම්බන්ධව පළමුව ස්තූතිවන්ත වන බවත්, ඒ වගේම දූකක් කණගාටුවක් හිත් රිදීමක් ද තිබෙන බවත්, අපි ප්‍රාදේශීය සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරු ලෙස සෑම මොහොතකම ඔබතුමන්ලාට සහයෝගය ලබා දුන් බවත්, ආපනශාලාවලින් බදු අය කිරීමට ගෙන ආ යෝජනාවේ දී පළමු අවස්ථාවේ දී ආදායම අහිමි වීම මත අපි විරුද්ධ වුණත් ඉන්පසු සාකච්ඡා කරලා යම් ප්‍රමාණයක හෝ ආදායමක් ලබා ගත හැකි නිසා ඒ සඳහා සහයෝගය ලබා දුන්නා. කිසිම විරෝධතාවයක් නොමැතිව අපි මන්ත්‍රීවරු සියලු දෙනා එසේ කටයුතු කරද්දී විපක්ෂයේ මන්ත්‍රීවරු ලෙස අප ද යෝජනා ඉදිරිපත් කරන නමුත් මා ඉදිරිපත් කරන ලද යෝජනාවලින් මෙතෙක් සිදු කරන ලද්දේ ඇතුංගාගොඩ සොහොන සුද්ධ කිරීම පමණයි. ඔබතුමාගේ මන්ත්‍රීවරුන්ගේ වැඩ කීපයක් කරද්දි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙත් වැඩ එකක් හෝ කරන ලෙස ඉල්ලා සිටින බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය</u>**

පසුගිය ජූලි 30 වෙනිදා හම්බන්තොට ඉන්දියානු කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය, දකුණු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුව සහ බෙන්තොට ප්‍රාදේශීය සභාව එක්ව සංවිධානය කළා ආයුර්වේද වෛද්‍ය සායනයක්. ඒ සඳහා වැඩි සංවිධාන දායකත්වයක් ලබා දෙන ලද්දේ ගරු සභාපතිතුමන්, ලේකම්තුමන් ගරු උප සභාපතිතුමන්, ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය. කන්දෙමුල්ල කනිෂ්ඨ විද්‍යාලයේ මෙය පැවැත්වුණේ. කන්දෙමුල්ල සුබ සාධක සමිතිය, කන්දෙමුල්ල උපේක්ෂා වැඩිහිටි සමිතිය, ආරක්ෂක කමිටුව මේ සඳහා සහයෝගය දැක්වූවා. හබුරුගල ආයුර්වේදයේ වෛද්‍ය තුමිය මතක් කරන්නම ඕන චරිතයක් වෛද්‍ය ඉෂංකා මල්කි. එතුමියගේ මග පෙන්වීම යටතේ තමයි මම මේ කටයුතු සිදු කළේ. සභාපතිතුමා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත්, ගරු සභාවටත් මම මේ අවස්ථාවේ මාගේ ස්තූතිය පුද කරන බව සඳහන් කරන ලදී.

**<u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>**

ඉදිරියේ දී ඇති වීමට නියමිත එල්නිනෝ තත්ත්වය පිළිබඳ පසුගිය සභා වාරයේ දී ද මා අදහස් දැක් වූ බවත්, කමිටුවක් පත් කොට බෙන්තර බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් අපට කළ හැකි දේ සාකච්ඡා කර වැඩපිළිවෙළක් සකස් කළ යුතු බවත්, ඒ වගේම මා මීට පෙර ද සඳහන් කළ ලෙස නළ ළිං කිහිපයක් හෝ පළාත් නිශ්චිත හෝ වෙනත් කුමන හෝ ප්‍රතිපාදන මත ඉදි කිරීමට හැකියාව ලැබේ නම් එය ඉතාමත්ම සුදුසු වන බවත්, ජයරත්න මන්ත්‍රීතුමා හා සභාපතිතුමා අතර ඇති වූ උණුසුම් තත්ත්වය ඇති වීමට අවශ්‍ය නොවන දෙයක් ලෙසයි මගේ මතය. මන්ත්‍රීතුමා තම යෝජනාව ඉදිරිපත් කළ විට ක්ෂණිකව ඒ සඳහා පිළිතුරක් ලබා දීමට උත්සාහ කිරීමයි මෙහි දී සිදු වුණේ. සභාවේ නීති රීතිවලට ගරු කරමින්, සංයමයෙන් යුතුව කටයුතු කිරීම සුදුසු වන බවත්, ඒ වගේම නිලුපුල් මන්ත්‍රීතුමා සඳහන් කළා විපක්ෂයේ යොජනා ඉටු නොකරන බවට. එහෙම නෑ මම දාපු යෝජනත් තියෙනවා තාම වැඩ නොකෙරුණු. ඒ නිසා ඒ පිළිබඳ සිත් රිදවා ගැනීමක් ඇති කර නොගන්නා ලෙසත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>**

මීට දින කිහිපයකට පෙර හබුරුගල ප්‍රදේශයේ පෞද්ගලික ඉඩමක තිබූ ගසක් කඩා වැටීමෙන් මාර්ග අවහිරතාවයක් සහ බෙන්තර ප්‍රදේශයටම විදුලිය ඇණ හිටීමක් සිද්ධ වුණා. සභාපතිතුමත් ප්‍රදේශයෙන් බැහැරව සිටි එම මොහොතේ ලේකම්තුමත්, තාත්ෂණ සේවා නිලධාරීතුමත්, කාර්ය මණ්ඩලයත් එකතු වී කඩිනමින් එම ගස ඉවත් කොට විදුලි බල මණ්ඩලයට නැවත විදුලිය යථා පරිදි සකස් කිරීමට අවශ්‍ය

වැඩකටයුතු සිදු කිරීමට අවස්ථාව සලසා දුන්නා. අපේ කාර්ය මණ්ඩලය කැපවීමෙන් කඩිනමින් කටයුතු කිරීම නිසා තමයි විදුලි බලය ඉක්මණින් නැවත ලබා ගන්න පුළුවන් වුණේ. නැත්නම් රාත්‍රී 12 පමණ වෙයි කියලා හිතාගෙන හිටියේ. කෑම බීම ලබා දුන්න ද ඒවාවත් ලබා නොගෙන මහන්සි වී රාත්‍රී 10 පමණ වන විට සමස්ථ බෙන්තරටම විදුලිය ලබා දීමට විදුලි බල මණ්ඩලය කටයුතු කළා. ප්‍රදේශයෙන් බැහැරව සිට මා නැවත පැමිණෙන විට ප.ව. 6.00ට පමණ. එම අවස්ථාවේත් ප්‍රාදේශීය ලේකම්තුමත් එම ස්ථානයේ රැඳී සිටියා. ඒ වගේම මේ දිනවල නිවාස අධිකාරියට අමතරව විවිධ ස්වෙච්ඡා සංවිධානවලින් නිවාස ලබා දීම් සිදු කරනවා. හබුරුගල ග්‍රාම සමිතිය මඟින් ද නිවාස ලබා දීමක් කළා. මීට දින කීපයකට කලින් ඒකේ මුල්ගල තැබීමක් වැනි දෙයක් සිද්ධ වෙලා තියෙනවා. ගෙදරටම ගිහින් සමිතියේ සාමාජිකත්වය අරන් දුන්නෙත් මම. හබුරුගල ග්‍රාම සංවර්ධන සමිතිය තමයි ඒ ගෙදර හදන්න නිර්දේශ කළේ. 2011 පමණ සිටයි මෙම සමිතියෙන් වාර්ෂික නිවාස ලබා දීම ආරම්භ කළේ. ග්‍රාම සංවර්ධන අරමුදල්වලින්. අපි විපක්ෂයේ මන්ත්‍රීවරු නිසා අපිව දැනුවත් නොකළත් අර ස්වෙච්ඡා සංවිධානයේ සාමාජිකයින්ව හරි දැනුවත් කරන්න කියලා මකක කරනවා. තෝරපු අයටවත් නොකියා වැඩ ආරම්භ කරාම ඒ අයට එන්නේ කලකිරීමක් බවත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 11.40 ට ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා ගරු සභාවෙන් පිටව යන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා</u>

මම මාස ගානකට කලින් ඉල්ලුවා කසල රැගෙන යන ට්‍රැක්ටරේ. පසුගිය දිනවල ක්ලීන් ශ්‍රී ලංකා වැඩ සටහන යටතේ දීප ව්‍යාප්ත වැඩසටහනක් කරලා ගොඩක් තැන්වල තිබෙන කුණු අපි අයින් කළා. සෙනසුරාදා ඉරිදා දවස්වලට කට්ටිය ආපහු කුණු ගෙනල්ලා පාරෙන් තියනවා. තියලා යනවා. ඊට පස්සේ ඒවා බල්ලො ඇදලා දානවා. ඒ අයට කිව්වම ඒගොල්ලො කියන්නේ ට්‍රැක්ටරේ එන වෙලාව දන්නේ නෑ කියලා වෙනදා වගේ දැන් මියුසික් එකත් නෑ කියලා. හැබැයි වුන් පාන් එකේ සද්දේ නැතුව අපිටම ආවේණික වෙනත් සද්දයක් දැම්මනම් හොඳයි. ට්‍රැක්ටරේ එන බව දන්නේ නෑ. ඒ නිසා පාරෙන් තියලා යනවා. මගේ ගේ ඉස්සරහත් කුණු ගෙනත් දාලා යනවා. ඊට පස්සේ ඒ හරියේ ඉන්න බෑ ගඳයි. ඒ කියන විදියට කුණු වෙන් කරලා තියන්නේ නැති නිසා සමහර ඒවා දාලා යනවා ගෙනියන්නෙත් නෑ. මේ නිසා කඩිනමින් ඒ සඳහා වැඩපිළිවෙළක් යෙදීමට කටයුතු කරන ලෙස සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා</u>

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තූතිවන්ත වෙනවා පසුගිය කාලයේ මා විසින් කළ යෝජනා කීපයක්ම ඉටු කර දීම සම්බන්ධව. මෙවර සම්බන්ධීකරණ කමිටුවට ද මාගේ යෝජනා නොමැති නිසා සම්බන්ධ වීමට නොහැකි නිසා සම්බන්ධීකරණ කමිටු සභාපති නිශාන්ත පෙරේරා මැතිතුමා මගේ කොට්ඨාසයේ විදුලි කණු 04 ක් ඉවත් කිරීමට මා කළ යෝජනාව ඉටු කර දීම සම්බන්ධයෙන් ස්තුති කිරීමට මෙම අවස්ථාව යොදා ගන්නා බව සඳහන් කරන ලදී,

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මම සභාපතිවරයා විදියට මගේ කණගාටුව ප්‍රකාශ කරනවා ජයරත්න මන්ත්‍රීතුමාට යම් හිත් රිදීමක් වුණා නම්. මට ඕන කරලා තිබුණේ එතුමාගේ ගැටලුවට පිළිතුර ක්ෂණිකව අදාළ නිලධාරියා මඟින්ම පැහැදිලිව පිළිතුරක් ලබා දීමට. මේ සභාව දැනට අවුරුදු 1 ½ කට ආසන්න කාලයක් පැවැත්වුවා. මම කවදාවත් කිසිම

මන්ත්‍රීවරයෙකුට කතා කරන්න අවස්ථාව නොදී ඉඳලා නෑ. මේකේ හිටපු සභාපතිවරුන්ට ප්‍රශ්නයක් ආවම සභාව ඉවරයි කියලා නැගිටලා ගිහින් තියෙනවා නමුත් මම එහෙම කර නැති බව සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>**
මම යෝජනාව කියලා ඉවර වෙන්න කලින් කතා කරන්න පටන් ගත්ත එක වුණේ. ඒ සම්බන්ධව තරහක් නොමැති බව සඳහන් කරන ලදී.

**8.3. <u>ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම :-</u>** නැත

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා:-</u>**
මෙතෙක් වෙලා සභාවේ රැඳී සිටිමින් සහයෝගය ලබා දුන් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු 20 දෙනාට ස්තුතිවන්ත වන බව පවසමින් ගරු සභාපතිතුමා විසින් සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

පෙ.ව. 11.50 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

.............................
ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව.

**<u>බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2026 අගෝස්තු මස මාසික මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන</u>**

**<u>සංශෝධන අංක 01 - ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධන:-</u>**
පසුගිය සභා වාර්තාවේ 18 වෙනි පිටුවේ 5.8.13 යෝජනාව යටතේ ඉදිරිපත් කළ 5 වන ඇස්තමේන්තුවේ "ඇටවලවත්ත නැගෙනහිර පාසල අසල චන්දන මහතාගේ නිවස ඉදිරිපස ඇති මාර්ගය" යන්න "ඇටවලවත්ත බටහිර පාසල අසල චන්දන මහතාගේ නිවස ඉදිරිපස ඇති මාර්ගය" ලෙස සංශෝධනය විය යුතුයි.

**<u>සංශෝධන අංක 02 - ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධන:-</u>**

පසුගිය සභා වාර්තාවේ 18 වෙනි පිටුවේ 5.8.12 යෝජනාවේ සඳහන් වන "අනුමත මූල්‍ය ප්‍රතිපාදන මුදල රු. මිලියන 20 කි" යන්න "අනුමත මූල්‍ය ප්‍රතිපාදන මුදල රු. මිලියන 2 කි" ලෙස සංශෝධනය විය යුතුයි.

......................

ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව.